GL 3065



# කඳුළු දැසට සිසිල ඔබමය ...

මොහමඩ් ඉර්ෂාඩ් හුසේන්

# *" Offer a Drop Of Love "*

(A small thing can make a big difference in a child's life)

*"Ash* Shifaa" (Children with Special Needs)

- ✓ A Charity Approved by the Government of Sri Lanka Gazette No. 1907/18
- ✓ Under Ministry of defense N. G. O. Reg. L-91704
- ✓ National Secretariat Persons with Disabilities Reg. No. MSSN/SPD/ R 121
- ✓ Ministry of Social Services and Welfare (Western Province)
  Reg. No. WP/SSD/C / DH /2011 / 16

We are a non fee levying Organization of excellence that provides comprehensive services for the "Children with Special Needs" We educate the children using modern teaching materials, instructional Rehabilitation, and Vocational training to individuals with developmental learning challenges. Whatever their physical & mental disability, it is to promote their development capabilities. This will enable them to adapt and adjust themselves to the surrounding environment, in order to live with their families and community. Age 3yrs onwards

*Services Menu* Psychological, Speech & language, Physiotherapy, Occupational, Counseling, Family support

BKT 0179
25/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# කඳුළු දැසට සිසිල ඔබමය...

මොහමඩ් ඉර්ෂාඩ් හුසේන්

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



83

දිවංගත ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ 23 වන අනුස්මරණ දිනය නිමිත්තෙන් සම්පාදිතයි.

මොහමඩ් ඉර්ෂාඩ් හුසේන්
242, කොලොන්නාව පාර, වැල්ලම්පිටිය.
දුරකථනය : 011 2547887

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

-පිදුම-

හිතට එන යම් දෙයක්
හැඟීම් සමග මුසුකර
සදා සිහිවන්නට
පැන් තුඩ කෙරෙහි මා සිත
නිරතුරු පොළඹවන
මගේ ආදර අම්මාට
සෙනෙහසින් පුදන්නෙමි.

මේ පොත එලිය දක්වන්නට නිබඳවම
සිහිකොට පසසමිය අතහිත දුන් සැවොම
මා පිය දෙපොල වැඩිහිටි ගුරුවරුද සැම
හට පුද කරමි හද පිපි නැමූ මලින් මම

# මම අගය කල පෙම්දස් මැතිඳු

ශ්‍රී ලංකාවෙ සුවිශේෂතම දේශපාලන නායකයෙකු හා රාජ්‍ය නායකයෙකුවූ ප්‍රේමදාස මැතිඳුන් උපත ලැබුවෙ මීට වසර ...92...ට පෙර වර්ෂ 1924 ජුනි මස 23 වැනි දිනයේදිය. එතුමා ශ්‍රී ලංකාව පාලනය කල ශ්‍රේෂ්ඨ ජන නායකයෙකි. කලට වෙලාවට වැඩ කල පුද්ගලයෙකි. ළමා පරපුරට දුන් කදිම ආදර්ශයක් නම් උදෑසනම නැගිට තම වැඩ කටයුතු ඇරඹීමයි.

එතුමා පිළිවෙලට අඳින පළඳින නිතර පිළිවෙලට තම හිසකෙස් පීරා පිරිසිදුව තබාගෙන සිටි නිරහංකාර ජන නායකයෙකි. එතුමා සතුව තිබූ තවත් ගුණාංගයක් නම්, යම් වැඩක යෙදීමට පෙර එය ඉතා හොඳින් කිරීමට මුල සිටම සූදානම් වීමයි.

එතුමා දුප්පතුන් හට උදවු කරන, ඔවුන්ට අනුකම්පා කරන, විශේෂයෙන් ළමා පරපුරට ආදර්ශමත් කතා කියන ඔවුන්ගේ දුක සැප සොයා බලන ප්‍රායෝගික පුද්ගලයෙකුද විය. ජනතාව අතරට බාධක කොතෙකුත් තිබියදීද නොබියවම ගමන් කල එතුමා කලාකරුවන්ටද අත හිත දුන්නේය.

පුදුම සැදැහැවත් හැඟීමක් ඇතුව ආගමික වතාවත් වල යෙදුනේය. සැම ආගමකටම එතුමා ගරු කළේය. ඔහු සතුව තිබූ තවත් හොඳ ගුණාංගයක් නම් කුඩා හෝ වැඩිහිටි කව්රුක් තමාට හොඳ දෙයක් කියා දෙනවා නම් එයට ඇහුම්කන් දීමයි. වරදක් දුටු තැන එය පෙන්වා දුන්නේය.

මම රූපවාහිනිය තුලින් දුටු දෙයක් නම් එතුමා පාර්ලිමේන්තුවේදි ද නොබියව නොසැලී තම අදහස් ප්‍රකාශ කල ආකාරයයි. ඔහු කළගුණ සලකන දයාබරිත හදවතක් ඇති සැබෑ මිනිසෙක් විය. ගෙවල් හදා රට පුරාම ජනතාවට සෙවණ දුන්නේය. ඉදිරියට යන්නට උනන්දුවක් දක්වන හැමදෙනාටම අතහිත දුන්නේය.

මෙ මටත් අතහිත දුන්නෙ එහෙමයි. ගම්බිම් දියුණුකර රටෙ ජනතාවට දුප්පත්කමින් මිදෙන්නට උදව් උපකාර කළේය. නගරවල පහසුකම් ගමන ගෙන ගියේය. මැති ඇමතිවරුන් සමග ජනාධිපති කාර්යාලයද ගමින් ගමට ගෙන ගියේය. ජනතාව වෙනුවෙන්ම රට දැයට යහපත පිණිස මුළු දිවියම කැපකළ උදාර සත්පුරුෂයා මා හොඳින් හඳුනා ගත්තා මට සතුටුයි. මට ඒ හැමවිටම විශාල ධෛර්යයක් ඇතිවෙනවා. මා දුටුවෙ ඔහුගේ සැබෑ නායකත්වයයි.

මගේ පැතුම එතුමන් ගමන්ගත් මග හඳුනාගැනීමයි. කඳු පාමුල සිට කඳු මුදුනට ඇති දුෂ්කර ගමන නිමකළ උත්සාහවන්තයා ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිඳුන්ය. මාගේ ගෞරවපූර්වක භක්තියෙන් උපහාරයක් නිතැනින්ම සදාකල්හි එතුමන්ට පිරිනැමේ.

# "ඔබේ නාමය සැමදාමත් අප අතරෙයි"

ඇදහිය නොහැක ඔබහට සිදුවුන විපත
ලක් ජනතාව තවමත් හඬනවා දසත
ඔබ නැති ලොවක කොතැනද අපහට සැපත
දුක් වේදනා පමණයි අපහට නියත

මගේ දුක කියමි කවිකර අද මේ විලසින්
වාවනු නොහැක නැගෙනා දුක් හද පතුලෙන්
නෙත් යුග තෙමෙනවා ගලනවා උණු කඳුලින්
ජනපතිතුමනි වෙන්වුණේ ඇයි අප අතරින්

පොඩි අය ගැනයි සැමදාමත් ඔබ සිතුවේ
දුප්පත් කමින් මුදවන්නයි වැඩ සැදුවේ
සුචරිත දිවිය තුළිනුයි ඔබ ලොව දිනුවේ
පොදු ජනතාව අතරෙයි ඔබ දිවි පිදුවේ

ඔබ මිය ගියේ නෑ මිය ගියේ රට වැසියොයි
ඔබ තනි වුනේ නෑ තනි වුනේ පොඩි මිනිහයි
ඔබ දුක් වුනේ නෑ දුක් වෙන්නෙත් අපිමයි
ඔබේ නාමය සැමදාමත් අප අතරෙයි

මා විසින් ජනහමු වෙදිකාවක පවත්වනු ලැබූ පළමුවැනි කථාවයි මෙ. මෙ කාලයේදී මගේ වයස අවුරුදු 8 යි. එවිට මම සුචරිත නිදහස් පාසලේද ශිෂ්‍යයෙක්.

1991 නොවැම්බර් මස 11 වැනි සඳුදා දින හෝමාගම 'මුණසිංහගම' විවෘත කළ දා.

*"මා සියල්ලටම පෙර ඉතා සතුටින් කියන්න කැමතියි මා වගේ දුප්පත් පවුලක කුඩා දරුවෙකුට මෙවැනි වේදිකාවකට ඒමට හැකි වූයේ අපේ ජනාධිපතිතුමාගේ උදාර සංකල්පය නිසයි.*

*එය මට ලැබුණු ලොකුම භාග්‍යයක්. විශේෂයෙන් මම මුස්ලිම දරුවෙක්. එයින් පැහැදිලි වන්නේ අපේ ජනාධිපතිතුමා දුප්පත් පොහොසත් භේදයෙන් තොරව, ආගම භේදයෙන් තොරව කාටත් එකයේ සලකන ආකාරයයි.*

*දැන් මා ප්‍රකාශ කරන්න සතුටුයි මම අද මෙතනට ආවේ ඇයි කියා. මම ආවේ පොඩි කතාවක් කරන්න අපේ රට ගැන. එසේම අපේ ජනාධිපතිතුමා ගැන.*

*අද අපේ මේ පුංචි රටේ උදාවී තිබෙන තත්වය ගැන ඔබ සැමට තරම් නුනත් මට තරමක් අවබෝධ වී තිබෙනවා. අපේ රට හුඟාක් දියුණු කරන්න දිවා රෑ වෙහෙසෙන අපේ ජනාධිපතිතුමාව පාලනයෙන් ඉවත් කරන්න අද බොහෝ දෙනෙක් උත්සාහ කරනවා. නමුත් මේ පුංචි මම මේ අවස්ථාවේ එකක් කියන්න කැමතියි. මගේ මව්වරුන්ට පියවරුන්ට සහෝදර සහෝදරියන්ට මෙන්ම අපේ රටට මෙතරම් සේවයක් කරපු, කරන, මේ ජනාධිපතිතුමා ඉවත් කරන්න නම් මේ ඉර හඳ පවතින තාක් හම්බවෙන්නේ නැහැ. ඒක ඉබ්බන්ගෙන් පිහාටු ගන්නවා වගේ වැඩක්. ඔය යම් යම් අය අපේ ජනාධිපතිතුමා ගැන මොනවා කීවත් අපේ රටේ මහජන මතය අපේ ජනාධිපතිතුමාට බව පුංචි මට ස්ථිර වශයෙන්ම කියන්න පුළුවන්.*

*බලන්න මව්වරුනි පියවරුනි, අපේ ගරු ජනාධිපතිතුමා මේ පුංචි අපට තේරෙනවා ඕනෑම දෙයක් කරනවා කිව්වොත් එය කරනවා. කලොත් යම්*

දෙයක් එය කියනවා. මේ වෙලාවේ මට 'පිදිය යුත්තන් පුදමු' කියන පොතේ කවියක් මතක් වෙනවා.

කිව්දේ කළා කළදේ හරියට කිව්වා
ජනසවි තනා පොදුජන හද දුක් ගිනි නිව්වා
කඳු මුදුනට නැගුණු ඔබ පාමුල බැලුවා
අපි ඔබ රකිමු කව්රුන් කෙරුවත් මොනවා

ඒ කවියේ අදහස බලන්න. එතුමා කියපු හැම දෙයක්ම කරලා තියෙනවා. කරපු හැම දෙයක්ම කියලා තියෙනවා. හරියට කඳු මුදුනකට අමාරුවෙන් නැගුණු කෙනෙක් ආපසු හැරී පාමුල බලනවා වාගේ මේ පුංචි අපි දිහා බැලුවා.

මේ අපේ උදාර නායකතුමා කොළඹට වෙලා සැප සම්පත් වින්දේ නැහැ. ගමින් ගමට යන්න පටන් ගත්තා. නිවසින් නිවසට යන්න පටන් ගත්තා. දුප්පතාගේ දුක සියැසින් දැක බලාගත්තා. එහෙම බලලා ඒ අයගේ දුක නිවන්න ජනසවිය දෙන්න පටන් ගත්තා. එමගින් දරුවන්ගේ අධ්‍යාපනය දියුණු කරන්න සෑම පියවරක්ම ගත්තා. ගම පුබුදුවමින් රට නංවන්න පටන් ගත්තා.

බලන්න මව්වරුනි පියවරුනි, මෙවැනි නායකයෙක් අපට ආයේ ඇති වෙයිද? මේ වගේ නායකයන් රටකට බිහිවන්නේ කලාතුරකින්. මේ වාගේ නායකයන් බිහිවීම කන කැස්බෑවා වියසිදුරෙන් අහස බැලීම වගේ දෙයක්. ඒ නිසා අපි අපේ ගරු ජනාධිපතිතුමා අපේ දෙනෙත වගේ අපි ආරක්ෂා කරන්න ඕනේ. එහෙම උනොත් පමණයි මේ පුංචි අපේ අනාගතයත් ඔබේ අනාගතයත් රටේ අනාගතයත් සෞභාග්‍යමත් වන්නේ.

දැන් මම කවියක් කියලා මගේ කතාව අවසන් කරන්නම්.

සුචරිත තුලින් බිහිවී ලොව නම දරන
පොදුජන හිතවතා අප සැම දෙන රකින
සැම අය වෙතම තුටු සිතහා පිරි නමන
ජනපතිතුමා දෙවි පිහිටෙන් වැජ බෙන්න''

1992 වසරේ අප්‍රේල් මස 27 වන දින අම්බලන්තොට 2 වැනි ඇඟලුම් කම්හල විවෘත කිරීමේ උත්සවයෙන් පසු ලුනම නගරයේදී අතිවිශාල ජනතාවක් හමුවේ පැවති ජනහමු වේදිකාවේ සිට මා පැවැත්වූ කථාවයි මේ.

*"ගරු කටයුතු සියලුම ආගමික නායක උතුමන්ලාගෙන් අවසරයි. අතිගරු ජනාධිපති උතුමාණෙනි, මැති ඇමතිවරුනි, අනිකුත් සියලුම සම්භාවනීය අමුත්තනි, මව්වරුනි, පියවරුනි, සහෝදර සහෝදරියනි.*

*අද මම මෙතැනට ආවේ කොළඹ පුරවරයේ සිටයි. නගරයේ සිටියත් ගමේ සිටියත් අප සැම කෙනෙකුටම විනෝදාංශ තියෙන බව අපි කව්රුත් දන්නවා. ඉතින් මගේ විනෝදාංශය හැටියට මා කරන්නේ සැම සෙනසුරාදාවකම පෙරවරු 7 සිට 8 දක්වා ගුවන් විදුලියේ ප්‍රචාරය වන අතිගරු ජනාධිපතිතුමා සහභාගී වුනු උත්සව වල එතුමාගේ කථා වලට සවන් දීමයි. මම මේ විදිහට කාලයක් කතා අහද්දී එක් සෙනසුරාදා දවසක එනම් මාර්තු මස 7 වන දින ප්‍රචාරය වුනු ජනාධිපති විද්‍යාලයේ එතුමා කල කතාවේ විනය ගැන ඉතා වටිනා ආදර්ශ පාඨයක් මට අහන්න ලැබුණා. එම කතාවේ එතුමා කිව්වේ විනයක් සමග ඇතිවන දැනුම ඉතාම අවශ්‍ය බවයි. එතුමා මෙන්න මෙහෙම ශ්ලෝකයක් කියා ජනාධිපති විද්‍යාලයේ දරුවන්ට පාඩම් කරන්න කිව්වා. එවිට මගේ අම්මා ඉක්මනට කොළ කැල්ලක් අරන් එතුමා කියපු ශ්ලෝකය පාඩම් කරන්න මටත් ලියා දුන්නා.*

| | |
|---|---|
| *විද්‍යා දදාති* | *විනයං* |
| *විනයාද්‍යාති* | *පාත්‍රතාම්* |
| *ප්‍රාත්තත්වාද් ධන* | *මාප්නෝති* |
| *ධනාත් ධර්මම් තතඃ* | *සුතං* |

*එහි තේරුම මෙන්න මෙහෙම කිව්වා.*

| | |
|---|---|
| *සිප්සත උගැන්මෙන් සදහට* | *හික්මීම* |
| *හික්මීමෙන් ලැබෙයි ගියතැන* | *නිසිවීම* |
| *නිසිවීමෙන් ලැබෙනු ඇත යසිසුරු* | *සැම* |
| *ඉසුරින් දහම දහමෙන් සුව* | *සැලසීම* |

*අප කාටත් තිබිය යුතුදේ තමයි විනය මෙන්ම දැනුම. මම එතුමාගෙන් ඉගෙන ගත්තු තවත් දෙයක් තමයි නිතරම අපි හොඳ දෙයක් ගැන කියා ගැනීම. කොතැනකදී හරි කාගෙන් හරි කොයි වෙලාවේදී හරි හොඳ දෙයකින් යමක් ඉගෙන ගන්න අපි උත්සාහ කරන්න ඕනා. අපේ අතිගරු ජනාධිපතිතුමා කිව්වා වගේ අපි කව්රුත් ඉගෙන ගත යුතුයි.*

*මම කැමතියි අපේ රට ගැන, අපේ ජනාධිපතිතුමා ගැන, එතුමාට රට නැංවීමට ආධාර කරන සහයෝගය දක්වන මැති ඇමතිවරුන් ගැන කතා කරන්න අවස්ථාවක් මට ලබාදුන් ජනාධිපති උතුමාණන්ට මගේ ගෞරවය පිරිනමමි. මුස්ලිම් දරුවෙක් වන කුඩා මගේ ආශාව මුදුන්පත් කරගැනීමට පුළුවන් වුනේ ජාති භේදයෙන් ආගම් භේදයෙන් කුල*

භේදයෙන් තොරව අපේ රට නැංවීමට සදා වෙහෙසෙන අපේ ජනාධිපතිතුමා බව සාඩම්බරයෙන් කියන්න ඕනා. මට මෙහෙම කියනකොට මතක් වෙනවා එතුමා නිතර කියන දෙයක් තමයි අප සැමට උත්සාහයත්, උනන්දුවත්, අධිෂ්ඨානයත් තිබෙනවා නම් මේ රටේ ජනාධිපති වෙන්නත් පුළුවන් කියන එක. ඒ සඳහා සියලුම දොරටු දැන් ඇරලා තිබෙන බව බලන්න කොයි තරම් උදාර කියමනක්ද කියලා. අපේ ජනාධිපතිතුමාගේ කියමනක් තමයි අවවාද දෙනවාට වඩා යමක් ආදර්ශයෙන් කර පෙන්වීම. ඉංග්‍රීසි කියමනක් තියෙනවා 'එග්සාම්පල් ඉස් බෙටර් දැන් ප්‍රිසෙප්ට්.' එහි අදහස අවවාදයට වඩා ආදර්ශය උතුම් යන්නයි.

බලන්න මව්වරුනි පියවරුනි මේ පුංචි අපට සමාජයේ උසස් තැන්වලට එන්න පුළුවන් බව ඔප්පුවී තිබෙනවා. එතුමාගේ ජීවන තොරතුරු දෙස මොහොතක් නෙත් යොමා බලපුවාම එතුමා මේ වගේ සාමාන්‍ය පවුලක උපන් කෙනෙක්. එතුමා අද මේ තැනට ඇවිල්ලා අපවගේ අයට එතැනට එන්නට මග පාදලා දුන්නට එතුමාට ඒ සමාජයේ එහෙම තැනක් තිබුනේ නැහැ. බාධක කම්කටොලු තුලින් තමයි මෙතැනට ආවේ.

නමුත් එතුමාට උත්සාහය තිබුනා. ධෛර්යය තිබුනා. එසේම එතුමා දැනගෙන සිටියා 'නෝ ක්‍රොස් නෝ ක්‍රවුන්' කියන ඉංග්‍රීසි කියමනක්. බාධාවක් නැතුව ඔටුන්නක් නැත යනුයි. එතුමා මතුවට අපට බාධාවක් නොවනසේ අපේ රටේ සාමය ඇති කිරීමට එතුමාගේ දැනම සාමය වෙත දිගු කරන්නේ ඒ නිසයි. මෙතුමා සාමයේ පියෙක් හැටියට අපි කව්රුත් හඳුන්වන්න ඕනා. එතුමා අප රටේ අනාගත පරපුර වන මේ පුංචි අපට පුදුම ආදරයක් තියෙන්නේ. ඒ නිසා තමයි මේ පුංචි අප දියුණු කරන්න මේ තරම් වෙහෙසක් දරන්නේ.

මට මතක් වෙනවා තවත් වැදගත් සිද්ධියක්. එනම් ජපානයෙන් ශ්‍රී ලංකාවට ලබාදුන් ආධාර යටතේ අලුතින් ඉදිකළ පැලියගොඩ පාලම විවෘත කිරීමේ උත්සවයේදී ඒ ප්‍රදේශයේ අවට පැල්පත්වල කුඩා ළමයි වැරහැලි ඇඳගෙන ඒ අවට සිටියා. මෙය දුටු අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමා මොකද කලේ? ඒ අහිංසක ළමයින්ව වේදිකාව අසලට කැඳවා ඉඳගන්න කිව්වා. ඒ වෙලාවේ මගේ වයසේ එම නංගිලා මල්ලිලා ට අයියලා අක්කලා ට පුදුම සතුටක් ඇතිවූ බව නියතයි. එම ළමයින් වේදිකාව ඉදිරිපස ඉඳගෙන රජ දරුවන් වගේ උත්සවය බැලුවා. බලන්න මව්වරුනි පියවරුනි එය මොනතරම් උදාර ක්‍රියාවක්ද කියලා. මෙවැනි අහිංසක දරුවන් ලංකාව පුරාම යනකොට එතුමාගේ නෙතට හමුවෙනවා. ඒ සමහර ළමයින් පාසැල් යන්න එක ඇඳුමක්වත් ගන්න හැකියාවක් නැති අය. ඒ තරමටම දුප්පත්කමින් පීඩිතුණ අහිංසක දරු දැරියන් ගැන හිතලා තමයි නොමිලේ පාසැල් නිල ඇඳුම් දෙන්න එතුමා අදහස් කලේ.

ඒ වගේම සෙවණ සරණ මාපිය කැපකරු ක්‍රමය මගින් කිසිවෙකුගෙන් පිළිසරණක් නොමැතිව අන්ත අසරණ දරු දැරියන් රාශියකගේ දුක් නිවා දමා තිබෙනවා. මෙම සෙවණ සරණ මාපිය කැපකරු වැඩපිළිවෙල යටතේ විශාල දරු දැරියන් සංඛ්‍යාවක් මේ වනවිට පෝෂණය ලබනවා. බලන්න මව්වරුනි පියවරුනි ලංකාවේ බිහිවුන මොන ජනනායකයාද මේ තරම් කුඩා දරු දැරියන් ගැන සිතුවේ.

පුංචි තැනක ඉඳලා ඉහලටම ආව ජන නායකයෙකු වශයෙන් එතුමා අද මුළු ලෝකයේම බැබලෙනවා. ඒත් එතුමා පසුකල ඒ පුංචි අවධිය එතුමා අමතක කර නැහැ. ඒ නිසා තමයි මෙතරම් උදාර වැඩපිළිවෙළවල් කුඩා අප වෙනුවෙන් ක්‍රියාත්මක කරන්නේ. පහල ඉඳන් ඉතිමං දිගේ ඉහල ඇවිත් ඉහල ආ පසු ඉතිමගට පයින් ගසන ගුණමකු සමහරක් මිනිස්සුන්ට එතුමා හොඳ ආදර්ශයක් වී තිබෙනවා. ඒ තමයි අන්ත අසරණ තත්වයේ ඉන්න අප වගේ දරු දැරියන්ට සැලකීම.

ඉතින් මෙවැනි නායකයෙක් අපට ඇති වෙයිද? ඒ නිසා පුංචි අපේ අනාගතය සරු වෙනවා දකින්න අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමාව අපේ දෙනෙත් වගේ අපි ආරක්ෂා කරගන්න ඕනා. එහෙම උනොත් පමණයි මේ පුංචි අපේ අනාගතයත් රටේ අනාගතයත් සෞභාග්‍යමත් වන්නේ.

දැහැමි නිදහස් සමාජයක් ගොඩ නැගීමට අපි බලාපොරොත්තු වෙමු. අප අන් අයට බරක් නොවෙමු. ජාති ආගම් වශයෙන් නොබෙදී එක ධජයක සෙවනේ අපි එක් සේසත් වෙමු. ගුණගරුක පුරවැසියන් ලෙස අප උපන් රටට පලදායී සේවයක් කිරීමට අපි සියලු දෙනාම අධිෂ්ඨාන කරගනිමු.

ස්තූතියි.”

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## "කළගුණ සලකන්න මෙමට විරිඳු වලින් අද දිනේ"

අල්ලාහ් දෙවිඳුනි මගේ
අවසර මට දෙනු මැනේ
කළගුණ සලකන්න මෙමට
විරිඳු වලින් අද දිනේ

මා මුස්ලිම් ලමෙක්ය
සැලකුවේ පෙම්දසුන්ය
නැහැ අමතක වූයේ අපට
සිහි කරනවා නිබඳව

පුංචි මෙමට දුන් අත
ගරු පෙම්දස් මැති සඳ
සිහි කරනවා පළමුව මම
මැතිඳුනි ඔබේ ගුණ කඳ

හැකියා මගේ දැනගෙන
නිබඳව අත දීගෙන
ඉදිරියටම ගෙනාව ඔබ
දෙවියෙකි මට හැමදින

රණසිහ පෙම්දස් සඳ
යලි සිරිලකෙ ජනිතව
ජනයට මෙහෙවර කරන්න
පෙර වාගේම කඩිසර

අනිකුත් මැති මැතිණියන්
සහ ආදර මව්පියන්
පිළිගන්නවා පහන් සිතින්
පෙම්දස් මැති නාමයෙන්

නිරතුරු මගේ දියුණුව
අත දුන් ජනපති සඳ
නොමැති අඩුව මකාලන්නේ
දෙවියනි ඔබ කොයිබද

හිසට සෙවණ සලසලා
කුසට අහර පුරවලා
ජනතාවගේ හද දිනු ඔබ
මුළු සිරිලක තනිකලා

පැගෙන ජනතාවගේ
ඉටු දෙවි ඔබ වුවානේ
එනමුත් කළගුණ අමතක
මිනිසුන් ඇත සිව්කොනේ

සිරිලකෙ නව නායක
ඇමතිවරුන් සැමදෙන
අල්ලා දෙවියො රැකදේවා
යන එන සියලුම තැන

විරිඳු වලට සවන් යොමා
මෙමා දෙසට නුවන් හෙලා
සිටිය නෝන මහත්වරුනි
තුති පුදනෙමි සිතින් මෙමා

පෙමදස් ජනපතිතුමන් දේශයේ දූ දරු පිරිසගේ අනාගතය වෙනුවෙන් නිබඳව කැපවීමෙන් කටයුතු කලා. පාසැල් දරුවන්ට නිල ඇඳුම් බෙදා දීමේ උදාර කර්තව්‍යය එතුමන්ගේ මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක වුණා. එම උදාර වැඩපිළිවෙල මෙහෙයවමින් එතුමා දේශයේ දූ දරුවන් වෙනුවෙන් දුන් පණිවිඩය මගේ හිතට විශාල සතුටක් ගෙන දුන්නා. පාඨක ඔබගේද දැන ගැනීම පිණිස පෙමදස් මැතිඳුන්ගේ එම පණිවිඩය මෙහි ලා සටහන් කරමි.

*මා ප්‍රියාදර දියණියනි, පුතණුවනි,*


*මෙම පාසැල් නිල ඇඳුම රෙදිපිළි පාර්සලය මා ඔබට ප්‍රදානය කරන්නේ ඉතාම සතුටිනි. නොමිලයේ අධ්‍යාපනය දීම, නොමිලයේ පාසැල් පාඨම පොත් දීම, නොමිලයේ දිවා ආහාරය සැපයීම සහ නොමිලයේ පාසැල් නිල ඇඳුම සැපයීම, නිදහස් අධ්‍යාපන සංකල්පය සර්ව සම්පූර්ණ වීම සනිටුහන් කරයි.*

*මෙම පාසැල් නිල ඇඳුම රෙදිපිළි ඔබට සපයන්නේ රජයේ සම්පත් වලිනි. රජයේ සම්පත් තර කිරීමට ඔබගේ දෙමාපියන් ඇතුළු මුළුමහත් ශ්‍රී ලාංකික ජනතාවම සිය දහදිය මහන්සිය වැය කරති. ඔබ අපගේ ලොකුම සම්පතයි. එම නිසා රජයේ සම්පත් වලින් ඔබගේ අවශ්‍යතා ලබාගැනීමට ඔබට අයිතියක් ඇත.*

*ඔබ සංවර වූ තරමට සිප්සතර හදාරා පුහුණුව ලැබූ තරමට රටේ සම්පත් ප්‍රමාණය තර වෙයි. ඔබගේ කුසලතා උපයෝගී කරගෙන ජාතික සම්පත් සම්භාරය තර කිරීමේ ප්‍රයත්නයට දායක වීමට ඔබ දැඩි අධිෂ්ඨානයක් ඇති කරගන්න. ඔබ වැඩිහිටි වයසට පත්වූ විට ඔබගේ මෙම වගකීම ඉටු කරනු ඇතැයි මම උදක්ම විශ්වාස කරමි.*

*එවිට ඔබ වගකිවයුතු පුරවැසියන් ලෙසට අප මාතෘභූමියේ අභිවෘද්ධියේත් සෞභාග්‍යයේත් කොටස්කරුවන් වනු ඇත. එතෙක් මගේ රජය ඔබ රැකගන්නවා ඇත.*

*මෙයට*
*ඔබේ අදරැති*



**රණසිංහ ප්‍රේමදාස**
ජනාධිපති

## එතුමා ප්‍රකාශ කල අදහස් එකතුවක්

විටින් විට විවිධ අවස්ථාවන්හිදී රටේ මුළු මහත් පොදු ජනතාව උදෙසා දිවංගත ජනාධිපතිතුමන් විසින් කරනු ලැබූ ප්‍රකාශ සමහරක් මා එකතු කර ගත්තේ විශාල ආශාවකිනි. එම ප්‍රකාශ කෙරෙහි ඔබගේද අවධානය යොමු කරන්නට මෙ පොතෙන් මම උත්සාහ කරමි.

***"ලොකු අය වඩාත් ලොකු වන්නේ කුඩා අයට ලොකුවට උදව් කල පමණටයි. ලොකු අය කුඩා අය පාගා දැමීමට වෙර දැරුවොත් සිදුවන්නේ කුමක්ද? ලොකුකමේ කුඩා බව ඉස්මතු වීමත් කුඩා අය වඩාත් ලොකුවට මූර්තිමත් වීමත්ය."***

ප්‍රේමදාස දර්ශනය, චින්තනය, වැඩපිළිවෙල යනු පුද්ගලයෙකුගේම ක්‍රියා කලාපයක් නොවේ. එය මෙ රටේ නැති බැරි ජනතාව සඳහා වන දර්ශනයයි, වැඩපිළිවෙලයි, ක්‍රියා පිළිවෙතයි. එය එලෙසම ක්‍රියාත්මක කරනු විනා ඊට විකල්ප ලෙස, විකල්ප නමවලින් එම වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට යෑම අපේ රටේ නැති බැරි ජනතාවට කරන විශාලතම අගෞරවයකි.

සාධාරණ සමාජයක් උදෙසා ජනපති ප්‍රේමදාස මැතිඳුන් ඇරඹුව ගමන යලි පණගැන්වීමට අපි අදිටන් කර ගනිමු.

මෙ රටේ සියලු ජනකොටස් අතර සාමය සමගිය අවංකව අපේක්ෂා කල නායකයෙක් ලෙස එතුමා හැඳින්වීමට පිළිවන. සෑම කාර්යයකදීම සිංහල දෙමල මුස්ලිම ආදී සෑම ජනකොටස් වලම අදහස් තේරුම ගනිමින් ක්‍රියාත්මකවූ එතුමා රටේ හැම ද්‍රවිඩ මුස්ලිම පක්ෂ වලම විශ්වාසය බොහෝ දුරට දිනාගෙන ඇත.

***"මා ඉන්දියාවට විරුද්ධ නැහැ. මගේ මව්බිම විදේශ හමුදාව විසින් අත්කරගෙන සිටීමටයි මා විරුද්ධ වූයේ. වරද කරන පාර්ශවය කවුරුන් වුවත් මගේ රටේ විදේශ යුධ හමුදා සිටීම ගැන මට එකඟ විය නොහැකිය. මම ඊට ඉඩ දෙන්නේ නැහැ."***
(ශ්‍රී ලංකාවේ බහු ජනවාර්ගික ප්‍රජාතන්ත්‍රවාදය)

*“මගේ පරමාර්ථය වන්නේ කිසිවෙක් හෝ පරාජය කිරීම නොවේ. මගේ පරමාර්ථය වන්නේ හැමදෙනාම ජයග්‍රහණය කරවීමයි. පරාජය කරවීම ලෙහෙසියි. ජයග්‍රහණය කරවීම එතරම් ලෙහෙසි නැහැ. අසමගිය නිසා අපේ ජනතාව දුර්වල වී ඉන්නවා. අසමාදානය නිසා අපේ ජනතාව දුර්වල වී ඉන්නවා. අසංවරය නිසා අපේ ජනතාව දුර්වල වී ඉන්නවා. මේ දුර්වලතා නිසා අප වැටී සිටින අගාධයෙන් අපේ ජනතාව ගොඩගැනීම මගේ මෙහෙවරයි. මගේ ජනතාව සමගි කරවන්නත් සුහද කරවන්නත් මම ඇප කැප වෙනවා. මගේ ජනතාව සන්සුන් කරවන්නත් ඔවුන් නුවණින් ක්‍රියා කරවන්නත් මගේ ජනතාවට නායකත්වය දෙන්න මම ඇප කැප වෙනවා. සාමයත් සමාදානයත් කරා මගේ ජනතාව ගෙනයන්න මම ඇප කැප වෙනවා. අසමගිය පරාජය කිරීම, නැතිබැරිකම පරාජය කිරීම, කලකිරීම පරාජය කිරීම තරම් විජයග්‍රහණයක් තවත් නැහැ.”*
(මහනුවර දළදා මාලිගාවේ පත්තිරිප්පුවේදී ජාතිය අමතා කල කතාව 1989 ජනවාරි 2)

*“අපි උත්සාහ කරන්නේ මේ රටේ ජනතාවට සමාන අයිතීන් හා සමාජ සමානත්වය සහතික කිරීමටයි. අපේ අහිංසක ජනතාව සදාකාලික දුගී බවේ හා වහල් බවේ තබනවාද යන ප්‍රශ්නයට අපේ පිළිතුර ‘නැත’ යන්නයි.”*
(ලෝක කම්කරු දිනය 1992)

*“අපි හදන්නේ නිවාස පමණක් නොවේ. මිනිසුන් හදනවා. නිවාස සම්පාදනය නිකම්ම ගොඩනැගිලි ඉදිකිරීමක් පමණක් නොව සුචරිතවාදී ව්‍යාපාරයක් වන්නේ ඒ නිසා.”*
(එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස කොමිසමේ 10 වන සැසිවාරය, කෙන්යාව - 1987 අප්‍රේල් 6)

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## පීඩිත පංතියට සැබෑ විප්ලවයක් උදාකළ උදාගම් නිර්මාතෘ රණසිංහ ප්‍රේමදාස මැතිඳුන්

*"මට විරුද්ධව එල්ලවන විවේචනවලට පිළිතුරු දීමට කාලය ගත කලහොත් මට වෙන කිසිම කාර්යයක නියැලීමට කාලයක් නැහැ. එසේ කරනවාට වඩා මම මේ ස්ථානය වසා දමා වෙනයම් කාර්යයක යෙදීම සුදුසුයි. මට හරි හැටි සිතෙනදේ මට හැකිතාක් හොඳින් ඉටු කිරීම මගේ අරමුණයි. අවසානයේ මගේ හෘද සාක්ෂිය මා නිවැරදි යැයි පවසනවා නම් කවුරු මොනවා කීවත් කමක් නැහැ. නමුත් අවසානයේදී මා වැරදි යැයි වැටහේ නම් සුරදූතයින් රැසක් මා නිවැරදි යැයි දිවුරා කීවත් පලක් නැත."*

(මෙම ලිපිය 1995 ජූනි 18 ඉරිදා දිවයින සංග්‍රහය සිළුමිණ පුවත්පත් වලද, ජූනි 23 ඩේලි නිව්ස් පුවත්පත් වල පලවිය.)

රණසිංහ ප්‍රේමදාස චරිතය විමසා බලන්නෙකුට මෙකී කියමන හා ඔහුගේ ජීවන රටාවේ අවස්ථාවන් බොහොමයක් අධ්‍යයනය කල හැකි වනු ඇත. එතුමාගේ ජීවිතයේ තිබූ සුවිශේෂම ගුණාංගයක් වූයේ තමාට හරි යැයි වැටහුණු දේ එහි අවසානය දක්වාම ක්‍රියාත්මක කිරීමයි. ඒ ගමනේදී හමුවන ඕනෑම අභියෝගයකට බාධකයකට විශ්වාසයෙන් මුහුණ දුන් අතර අවසානයේ ජයග්‍රහණය හිමිකර ගත්තේය. ඒ ජයග්‍රහණ කිසි කලෙක පෞද්ගලික ජයග්‍රහණ නොවූ අතර මේ රටේ නැති බැරි ජනතාව නගා සිටුවීමට ගත් ප්‍රයත්නයන්හි ජයග්‍රහණ විය.

# ජීවත්වූ පෙම්දසුන්ට වඩා මියගිය පෙම්දසුන් බලගතුයි

උපදින කවරුත් ස්ථිරවම රැගෙන එන දෙය මරණය පමණයි. හතුරෙකු වුවත් මිය ගිය විට "අනේ අපොයි!" කියූ සමාජයක අපේ පැල්පතකින් මතුවෙච්ච අපේ පංතියෙන් මතුවෙච්ච නායකයෙක් ඝාතනය කල අවස්ථාවක ප්‍රීති ඝෝෂා නැගුවා, කිරිබත් පිසුවා, රතිඤ්ඤා පත්තු කලා. එය එතුමාට කල අපහාසයක් නොවේ. එය මනුෂ්‍යත්වයට කල අපහාසයක්. "සත්‍යය කවදා හෝ ජය ගනියි" යන ප්‍රේමදාස කියමන සනාථ කරමින් එදා එතුමාගේ මළගම දා ප්‍රීති ඝෝෂා නැගූ අය අද එතුමාගේ ගුණ වර්ණනා කරනවා. "ප්‍රේමදාස මහත්තයා හිටිය නම් අපේ දුක ගැන බලනවා" යැයි කියනවා. ජීවත්වූ ප්‍රේමදාස මැතිඳුන්ට වඩා මියගිය ප්‍රේමදාස මැතිඳුන් බලවත් වග මගේ හිතට හැඟෙනවා. එදා ඒ වුනු අවාසනාවන්ත සිද්ධින් මගේ සිත තුලින් කවදාවත් බැහැර යන්නේ නැහැ.

එක බිමකට එක ප්‍රදේශයකට නොව මුළු රට පුරාම සංවර්ධන ක්‍රියාදාමය දියත් විය යුතු යැයි තේරුම් ගත් එතුමා ඒ හැම වැඩපිළිවෙලක්ම මුළු රට පුරාම ව්‍යාප්ත කිරීමට උත්සාහ දැරීය.

එතුමා උදාගම් හැදුවේ එක මැතිවරණ කොට්ඨාශයකට නොව මුළු රටටමය. ජල සම්පාදන යෝජනා ක්‍රම ඇති කලේ මුළු රටටමය. ජනසවිය දුන්නේ මුළු මහත් ලංකාවටමය. ඇඟලුම් කම්හල් තැනුවෙත් එලෙසමය. එතුමා ක්‍රියාත්මක කල දරුවන්ගේ දිවා ආහාර වැඩපිළිවෙල, නිල ඇඳුම්, සෙවණ සරණ මාපිය කැපකරු ක්‍රමය ආදී ඕනෑම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන විට එකම මොහොතේ මුළු රට පුරා ව්‍යාප්ත කලේ සම්පත් බෙදී යනවිට රට පුරා නොබෙදීමෙන් අප මුහුණ පා ඇති ගැටලුව හොඳින් හඳුනාගත් නිසයි. උතුරේ සිට දකුණටත් බස්නාහිර සිට නැගෙනහිරටත් එකම මොහොතේ එකම වේලාවක හැම ජන කොටසකටම යමක ප්‍රතිලාභ හිමිවූ යුගයක් වෙත්නම් ඒ ප්‍රේමදාස යුගය බැව සාධාරණව ලියන ඉතිහාසකරුවෙකුට නොලියා නොහැකි කරුණක් වනු ඇත.

කොල කැබැල්ලකින් රටම අක්‍රියා කල යුගයක විශ්ව විද්‍යාල හා පාසැල් වැසිගිය යුගයක නිල නොවන ඇඳිරි නීති පැනවුණු යුගයක ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය අවසන් හුස්ම හෙලමින් සිටි යුගයක ඡන්දය වෙනුවට උණ්ඩය රජකළ යුගයක දේශපාලන නායකයන් අමු අමුවේ ඝාතනය කරමින් සිටි යුගයක "අපට කිසිවක් නැහැ. බිය සැක නැතිව නිවසේ නිදාගන්න අවකාශය පමණක් සලසා දෙන්න" යැයි මේ රටේ ජනතාව හඬ නැගූ යුගයක ජනපතිධුරය භාර ගනිමින් එදා එතුමා මුහුණ දුන් අභියෝගයක් අමතක කර දමන්නට අද ඇතැමුන් දරන උත්සාහය තරම් සාහසිකත්වයක් තවත් ඇත්දැයි විමසා බැලීම වටියි.

සාධාරණ සමාජයක් උදෙසා ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා ඇරඹූ ගමන යළි පණගැන්වීමට අපි අදිටන් කර ගනිමු.

(ඉම්තියාස් බාකිර් මාකර් ශූරීන්ගේ 'යුගයක මෙහෙවර' නම් කෘතියෙන් උපුටා ගන්නා ලදි.)

# සිංහයෙකු මෙන් ප්‍රශ්න වලට මුහුණ දුන් ප්‍රේමදාස ජනාධිපතිතුමා

එතුමාගේ මෙම වැඩපිළිවෙලවල් නිසි ලෙසින් හා ගැඹුරින් අධ්‍යයනය නොකොට එහි ප්‍රතිඵලය ගැන නොසිතා අපේ මව් වැඩපිළිවෙලක් නිසාත් බටහිරින් හෝ වෙනත් පැත්තකින් නොපැමිණි වැඩසටහන්වූ නිසාමත් එල්ලවූ විවේචන සුළු පටු නොවේ.

“අපගේ පැන විසඳලන්න පිටරටවල නුවණ එපා” යැයි වරෙක එතුමා රස කවි සිතිවිල්ලක් සටහන් කලේ අපටම උරුමවූ ගමන් මගක් ඇති බවට එතුමන් තුලවූ අවබෝධය නිසයි. ප්‍රේමදාස මැතිඳුන්ගේ වැඩසටහන් සරදමට ලක් කල උදවියට දැන් යලිත් ඒ ගැන ගැඹුරින් සිතා බලන්නට කාලය එළඹ ඇත.

## “නව එළියකින් පිබිදුණු ලක් දෙරණ මගේ”

ජාතිය කුලය ආගම නැහැ සැලකුවේ
එනිසයි මමත් මෙය එළි දැක්වූවේ
සුදුස්සාටමය නිසි තැන හිමිවූවේ
මුස්ලිම දරුවෙකුය කියලා නැහැ කොං කෙරුවේ

එකමත් කාලයක සිසිලක් බිමට මගේ
දුක් කම්කටොලු මැද ගතකල අඳුරු යුගේ
ඉක්මන් ගමනකින් දුරුකළ යුගයේ රගේ
දැක්මට ඔබේ නැති ඇස් කුමකටද හැහෙ

හැත්තෑ හතට පෙර තිබු ඒ අඳුරු යුගේ
දුරුවිය වැඩවලින් මේ ජනසවිය වගේ
විදුලිය ජලය කෙත්වතු හැමතැනම වගේ
නව එළියකින් පිබිදුණු ලක් දෙරණ මගේ

ගොවියා රජෙක් කොට මේ මිහිතලය පිට
සහලින් මුළු දිවයිනම පෝෂණය කොට
මහ ජලකඳින් දෙන විදුලිය දකින විට
පෙම්දස් මැතිඳුට අද ණයගැතිය රට

පෙම්දස් ජනපතිඳු ගුණ අපි සිහිකරමු
එතුමන් ගිය ගමන යලි පුබුදුවාලමු
නැති බැරි අයගේ දුක් දොම්නස් දුරුකරමු
ඒ මග යන්න අපි කවරුත් එකතුවෙමු

අම්මෙ තාත්තේ අයියේ අක්කේ නගේ
පුංචි අපට කල සේවය සැමදා මම කරමි අගේ
යුතුකම දන්න හෙලවිරු රජ පුතුන් වගේ
රට රැකගන්න පෙම්දස් මැති කෙනෙකි ඒ යුගේ

මගේ හැකියාවන් මට එළි දක්වන්නට මට අතහිත දුන්නේ පෙමදස් මැතිඳුන්ය. එතුමා නායකත්වය දුන් පක්ෂය එතුමා මෙන්ම මට විශ්වාසයි. එතුමන්ගේ අභාවයෙන් පසුද පක්ෂයේ උන්නතිය වෙනුවෙන් මම ඉදිරියට ගියා.

මගේ ජීවිතේ මා වැඩිපුරම බියට පත්වූ දිනය මට කිසිදා අමතක වන්නේ නැහැ. මගේත් මගේ අම්මාගේත් ජීවිතය අනුනවයෙන් බේරුණු ඒ භයංකාර සිද්ධිය මගේ ඇඟ තවමත් සලිත කරවයි. විශාල ශබ්දයක් සහිත කළු දුමෙන් පරිසරය වසාගත් ඒ අමිහිරි සිදුවීම දේශයට වටිනා ජීවිත බොහෝමයක් අහිමි කරන්නට සමත් වුණා. ජනහමු වේදිකාව පසෙකින් කුඩු පට්ටම් වී ප්‍රචාරක රැලියේ සිටි එක්සත් ජාතික පක්ෂයේ නායකයින් ලේ විලක් මැද සිහිසුන්ව සිටියදී මගේ අම්මා සමග වේදිකාවෙන් පහලට වැටී කිසිවක් කරගත නොහැකිව සිටියා. ඒ අවාසනාවන්ත සිද්ධිය මගේ ජීවිතයේ මා අත්විඳි භයානකම සිදුවීමයි.

පසුව 1994 ඔක්තෝබර් මස 29 වන දින දිවයින පුවත්පතට මම ඒ විග්‍රහය කලේ මෙහෙමයි.



සිංදු කියනකොට මගේ උගුර හිරවුණා

1994 ජනපතිවරණයේ එක්සත් ජාතික පක්ෂයේ පළමු ජන හමුව මරදාන ටවර් රඟහල අසලදී ගාමිණී දිසානායක මැතිතුමන්, සජිත් ප්‍රේමදාස මැතිතුමන් හා හේමා ප්‍රේමදාස මැතිනිය සමග වේදිකාවේදී.



දරුවන්ට ප්‍රමුඛත්වය දුන් ඔහු...



මා වැනි
වර වර ලඟට
දුක සැප
අසන තිරිදෝ දැන්

බිලින්දා
කැන්දා
කුමන්දා
කොයින්දා

තවත් ජනහමුවකදී මා විසින් කල කතාවක්.

"අද මා මෙතැනට ආවේ කොළඹ ඉඳලා. මෙ අපේ උත්තම නායකයාණන් අප ගුණාත්මක බුද්ධිමත් දරු පිරිසක් වශයෙන් මෙ සමාජයට බිහි කිරීමට අපේ රජය වැය කරන්නේ එතුමාගේ පරම යුතුකමයි.

එතුමාගේ මෙවැනි උදාර සේවා අපි කවුරුත් අගය කල යුතුයි. මෙ අම්මලාගේ තාත්තලාගේ අක්කලාගේ අයියලාගේ අපි සියලූ දෙනාගේම දූ දරුවන් තම ස්වශක්තියෙන් නගා සිටුවීමට නොමිලේ පොත්පත් නිල ඇඳුම් දිවා ආහාර මෙවැනි සියලූදේ ගැනම් සොයන්නෙ ඇයි? මෙතුමාට හොඳ සැප සම්පත් පිරුණු ජිවිතයක් ගත කරන්න බැරිවද ? එනමුත් එතුමාගේ හිතට අවංකව වැඩ කල යුතුයි කියා තමා තම දරුවන් සේ මේ රටේ සිටින සියලු දරු පිරිස ගැන නොයෙක් අන්දමේ සහන ලබා දෙන්නේ සමහර අම්මලා තාත්තලා තම දරුවා ගැන කිසිම ඕනෑකමකින් වැඩ කටයුතු කරන්නේ නැහැ. ඔය ගැන මම දන්නේ කොහොමද කියලා ඇහැව්වොත් ප්‍රශ්න වැඩි හරියක්ම දූ දරුවන් පළමු වසරට ඇතුලත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර පවා දාපු නැති අම්මලා ඒ තරමටම නොසැලකිල්ල දූ දරුවන් ගැන කිසිම හෙවිල්ලක් බැලිල්ලක් නැති දෙමව්පියෝ. ඉතින් බලන්න. මේ සුළු දේ ගැන හිතන්න බැරි අම්මලා මම මෙ කිව්වේ උදාහරණයක් වශයෙන් අප දෙමව්පියන්ට සිමා වෙච්ච ගේ දොර වැඩපල සහ තම දරුවන් ගැන සොයන්න කාලය නැත්නම් අපේ උතුමාණන් මොන තරම් දේවල් අප ළමා පරපුර වෙනුවෙන් කරනවාද? එතුමාට රජ සැප විඳින්න බැරිවද? ඔය තරම් දේවල් අප වෙනුවෙන් කරන්නේ. අපේ උතුමාණන් අප පියෙක් හැටියට හැඳින්වූවාට කිසිම වැරැද්දක් නැහැ. එතුමා දැන් නිල ඇඳුම් ප්‍රශ්නයත් විසඳනවා. දැන් අපේ දෙමාපියන්ට තවත් පහසුයි.

අපේ උතුමාණන්ට අවශ්‍ය වෙලා තියෙන්නේ මෙරට නැති බැරි ජනතාව ඇති හැකි අය බවට පත්කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක්.

තමන් විසින් ජනතාවට දෙන ලද පොරොන්දු එලෙසින්ම ඉටු කිරීම එතුමාගේ විශේෂ ගුණාංගයයි. මුලින් දෙන පොරොන්දු පමණක් නොව ඊටත් වැඩි අමතර දෑද ජනතාවට ලබා දීමට එතුමා නිරතුරුවම සූදානමව සිටියි. මෙතුමාට දුප්පත් ජනතාව කෙරෙහි උපන් අනුකම්පාවෙන් ඔවුන් සැපවත් කිරීම සඳහා ක්‍රියාත්මක උනන්දුවක් දැනුමක් ඇති එකම නායකයෙකු වශයෙන් ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස උතුමාණන් ඉතිහාසගත වීමට ද එය හේතුවක් වී ඇත.

රටක අනාගතය දෝතින් භාර ගන්නට සිටිනුයේ වත්මනයේ සිසු දරුවන් හැටියට සිටින පිරිසය. සිසු දරුවන්ගේ ජීවනය සකස් විය යුත්තේ ගුණ ධර්මයෙන් පෝෂිත අධ්‍යාපන ක්‍රමයන් මගින් බව අපි මතක් කර ගත යුතුයි. එහෙත් ජනාධිපතිතුමා අද එම පොරොන්දුව ඉටුකර ඇතිවාක් පමණක් නොව එතෙක් දුප්පත්කම දෝතින්ම තුරුළු කරගෙන ඉතා අසරණව දිවි ගෙවූ පුද්ගලයන් ලක්ෂ ගණනකට එමගින් දෙපයින් නැගී සිටීමේ හැකියාවද ලබා දී ඇත.

*ජනසවිය කියන්නේ අපි මේ හිතනවා වගේ නිකංම නිකං ජනසවියක් නොවේ. එය ඉතා පුළුල් ගැඹුරු එකක්. එය සමාජයේ පත්ලේ සිට ලියලමින් වර්ධනය වෙමින් අවසානයේදී මුළු සමාජයම වෙලා ගන්නා පරිවර්තන ව්‍යායාමයක්. මෙය එක් එක් පුද්ගල කණ්ඩායමක්, සමාජය, කලාපය, යන පිළිවෙලට බැඳෙන පහල සිට ඉහළටත් ක්‍රියාත්මක වන දර්ශනයක්. මේ නිසා ජනසවිය අවසාන අවස්ථාව වනවිට සමාජයේ සිටින සෑම අයෙක්ම මොන ආකාරයකින් හෝ සම්බන්ධිත අය බවට පත්වීමෙන් මුළු සමාජයේම යහපත් පරිවර්තනයක් ඇති වෙනවා.*

*රටක තිබෙන වටිනාම සම්පත මිනිස් සම්පතයි. අපේ රටේ කුඩා ගම්මානවල ජීවත්වන දුප්පත් මිනිස්සු කියන්නට බැරි තරම් වටිනාකමක් ඇති නිර්මාණාත්මක පිරිසක්. මෙ අයගේ නිර්මාණ හැකියා ශාරීරික හා මානසික ශක්තියට රටේ දියුණුව සහ ආර්ථික වර්ධනය සඳහා යොදා නොගෙන දුප්පත් ජනතාව සතු කුසලතාවයන් හා ඔවුන්ගේ අවංක කැපවීම රටේ දියුණුව සඳහා යොදාගත යුතුම බව තේරුම ගත් ශ්‍රීමත් ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ජනසවිය වැඩපිළිවෙල අපේ රටට හඳුන්වා දුන්නා.*

*පරමාර්ථය ජනතාව ජීවත් කරලීම, දිළිඳුකම තුරන් කිරීම අරමුණ කරගත් මෙම වැඩසටහන දිවයින පුරා පියවරෙන් පියවර ක්‍රියාත්මක කරනු ඇත. එය ආරම්භ කරනුයේ අතිශයින්ම දිළිඳු ජනයාගෙනි. කිසිවක් නැති දුප්පත් පවුලක් ඉන් ප්‍රාග්ධනයක් ඇති පවුලක් බවට පත්වෙනවා.*

*නැති කමින් පමණක් නොව බැරි කමින්ද මිරිකුණු පවුලක් දැන් එම ප්‍රාග්ධනය හිමිකම තිබීමෙන් ඇතිකමක් ඇති පවුලක් පමණක් නොව හැකිකමක්ද තිබෙන පවුලක් බවට පත්වෙනවා. ඉන් ඔවුන්ගේ අදහස් උදහස් වලද ගති පැවතුම් වලද දියුණුවක් බලාපොරොත්තු වීම සාධාරණයි නේද?*

*මෙතුමා ගමින් ගමට නිවසින් නිවසට ගොස් දුප්පතාගේ දුක සියැසින්ම බලාගන්නවා පමණක් නොව ගමින් ගමට මෙවැනි කර්මාන්ත ජනසවිය තුලින් බිහිවූ නව රැකියා අවස්ථා නිසා අපි වැනි කුඩා දරුවන්ගේ අනාගතය දීප්තිමත් කිරීමට ලබාදී ඇති අවස්ථා අගය කල යුතුයි. මේ තුලින් ශක්තිමත් අනාගත පරපුරක් බිහිකිරීම ගැන අපේ ජනාධිපතිතුමා ළමා පරපුර වෙනුවෙන් මගේ භක්ති ආදරය මෙහිදී පුදකරමි. අපි දුප්පත් ජනතාව උනත් හොඳ ජනතාවක්.*

*එතුමා ළමා පරපුර අගය කරන හැටි සුළු දෙයකින් අපට හඳුනාගන්න පුළුවන් නේද? මේ බලන්න පැදුරක් එලලා මේ මං වගේ දරුවෙක් උත්සවය නරඹන ආකාරය. එතුමාට තියෙන්නේ පුදුම ආදරයක් හැඟීමක්.*

*මෙතෙක් මේ රටේ බිහිවූ නායකයන්ගෙන් පුංචි අප වෙනුවෙන් මෙතරම කැපවී වැඩ කලේ වෙන කවරුත් නොව අපේ ඉටු දෙවියානන් වන ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා බව මම ඉතා ආඩම්බරයෙන් මේ මොහොතේ මතක් කරන්න කැමතියි.*

ඇත්ත වශයෙන්ම මෙතුමා පුංචි දරුවන්ගේ සුවඳ බැලූ උත්තම නායකයෙක්. මෙතුමා පොඩි මිනිසාගේ දුක හඳුනන හදවතක් ඇති කෙනෙක්. ලොකු උදවියට මිනිසාගේ ප්‍රශ්න හඳුනාගන්න තේරුම් ගන්න බැහැ. එහෙත් පොඩි තැනකින් අද රටේ ඉහලටම ආපු අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමාට පොඩි මිනිසාගේ දුක තේරෙනවා. ඒ නිසා තමයි මෙතුමා මෙ නැතිබැරි උදවිය ඇති හැකි අය කරවා රට සමෘද්ධිමත් කරන්න උත්සාහ ගන්නේ. මෙහෙම කියනකොට මට ලස්සන කවියක් මතකයට එනවා.

දුකකට පිහිට වන්නට සුළු අය විතර
ලොකු අය කියන අයගෙන් නැති කිසිම වර
තිබහට වතුර බොන්නට සුළු ලිඳ විතර
කිසිවිට පිහිට නැති ගැඹුරැති මහ සයුර

එදා සුචරිතයෙන් බිහිවූ අපේ උතුමාණන් එතුමා 16 වන වියේදී සුචරිතය දියුණු කල දෙවියන් පවා එතුමාට ආසිරි පතනවා ඇත. ඒ කුඩා ශිෂ්‍යයා අද ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා වන තුරුම ඉදිරියට ආවේ මෙතුමාගේ මෙම නිහතමානී ගුණය නිසා බව මම ආඩම්බරයෙන් කියන්න කැමතියි.

මෙහෙම කියනකොට මට මතක් වෙනවා අපේ ජනාධිපතිතුමාට කුඩා කාලයේ වෙච්ච සිද්ධියක්.

විභාගයට පෙනී සිටින්නට යන අතරතුර බසයක ගිය එක් කෙනෙක් පිටතට බුලත් කෙල ගැසූ විට එතුමාගේ සුදු කමිසයට වැදී කිලිටි වුණා. නමුත් එතුමා කිසිම කැත වචනයකින් අපහාස කලේ නැහැ. මෙය දුටු එළවලු අම්මා කෙනෙක් බුලත් කෙල සෝදා හැරියා. මෙතුමාට විභාගයට යන්නට උදව් කලා. මෙතුමා එම විභාගයෙන් උසස් ප්‍රතිපල නෙලා ගත්තා. ඇත්ත වශයෙන්ම මෙතුමාගේ කුඩා කාලය අපට පමණක් නොව අප සියලු දෙනාටම හොඳ ආදර්ශමත් එකක්.

පොඩි අය සමග මතු ලෝකය සුවඳ දෙනා
දහසය වැනි වියේදී සුචරිතය තනා
ඒ මග යමින් රට ඇය සමය පුබු දනා
ජනපති දිනේ දිගුකල් දිනාමිණ ලෙසිනා

ජනාධිපතිතුමා නිතර කියන දෙයක් තමයි එතුමා තෙම්පරාදු වෙලා ඉන්නවයි කියන එක. ඒ කියන්නේ එතුමාගේ ජීවිතය පුරා ගල ගිය ආදර්ශය නිසා. පොඩි ළමයි වුනාම අපි කවරුත් කැමතියි සෙල්ලම් කරන්න. දුවන්න, පනින්න, නටන්න, ගයන්න ආදී වශයෙන්. මට මෙතුමා ගැන හොඳ දැනුමක් තියෙනවා. ඒ කියන්නේ මෙතුමා දන්නවා අපි කවරුත් හැරෙනකොට මෙකටමයි හැරෙන්නේ කියලා.

මට සිමක් අද වගේම මතකයි. 1991 සැප්තැම්බර් මස 19 වන දින නුවර පැවැත්වුන එක්සත් ජාතික පක්ෂ රැස්වීමෙදී මම දෙමව්පියන් සමග සහභාගි වුණා. එවිට ජනාධිපතිතුමා

මා දුටු ජනාධිපතිතුමා සිංදුවක් කියන්න අවස්ථාවක් ලබා දුන්නා. එවිට මට පුදුම සතුටක් ඇති වුණා පමණක් නොව එදා සිට අපේ ජනාධිපතිතුමා සහභාගී වන උත්සව වලට සහභාගී වන්නට මට ධෛර්යක් ඇති වුණා. එය මගේ ජීවිතයේ අමතක නොවන දිනයක් පමණක් නොව මට ප්‍රීතිමත්ම අවස්ථාවක්. එතුමා අප සියලු දෙනා වෙනුවෙන් ඇප කැප වෙන හැටි අපේ හිත් වල කාවැදිය යුතුයි. මෙතුමාගේ මෙවැනි උදාර සංකල්ප තුලින් තමා මට මෙවැනි භාග්‍යයක් ලැබුනේ. ඉතින් බලන්න මව්වරුනි පියවරුනි මෙ පුළු සිද්ධිය මොනතරම එතුමාට අප ගැන හැඟීමක් තියෙනවාද කියලා.

අපේ උතුමාණන් කොස්ගොඩ 'පියගම' දී කියපු කතාවක් මා මතක් කරන්න කැමතියි. එතුමාගේ පියා සැම සෙනසුරාදාවකම එතුමාව නාට්‍ය බලන්න එක්කරගෙන යනවා. ඒ දවස්වල පළමුවෙනි පංතියේ ටිකට පතක් රුපියල් පහයි. පලවෙනි පන්තියට තියෙන්නේ පේලි පහක් හෝ හයක් පමණයිලු. එම ටිකට පතට ඕනෑම පේලියක වාඩිවෙන්න පුළුවන්ලු. නමුත් එතුමාගේ පියා ජනාධිපතිතුමාව වාඩි කරවන්නේ පස්වැනි පේලියේ හෝ හයවැනි පේලියෙලු. දවසක් මෙතුමා තම පියාගෙන් ඇහැව්වා ඇයි තාත්තේ අපිට පලවෙනි පන්තියේ ටිකට එකක් අරගෙන පළවැනි පේලියේ වාඩි වෙන්න බැරිද කියලා. එවිට පියා පැවසුවේ පළවැනි පේලි තියෙන්නේ ප්‍රභුවරුන්ට කියලයි. ඉතින් අපි පළවැනි පේලියේ වාඩි වුනාම සංවිධායක අය කියයි ඒ පේලි තියෙන්නේ උසස් අයට නිසා අපිට එතැනින් නැගිටලා පිටිපස්සට යන්න කියලා. ඉතින් අපි මොකටද ඒ අයට පල් වෙන්නේ. මමත් ඕනෑම උත්සවයකට ගියාම මගේ අම්මට කියන්නේ අපි පිටිපස්සෙම ඉමු කියලයි. ඉතින් බලන්න ජනාධිපතිතුමාගේ ඒ ක්‍රියාවෙන් පුංචි අපත් පාඩමක් ඉගෙන ගත්තා නේද?

මෙතුමාගේ සැම කතාවකම අපිට හොඳ දේවල් දැන කියාගන්න ලැබෙනවා. එතුමා කියන දෙයක් තමයි කොතැනකදී හරි කොයි වෙලාවේදී හරි හොඳ දෙයක් දැන කියා ගැනීම.

අම්මෙ තාත්තේ මේ පුංචි මට ජනාධිපතිතුමා කිව්වොත් ඊට වඩා දෙයක් නැහැ. අප ළමා පරපුරට මෙතුමාගෙන් කෙරෙන සේවය කියා නිම කරන්න බැහැ. එය අපි කව්රුත් අගය කල යුතුයි. නිතර නිතර වගේම මතක් කල යුතුයි. එය සමහරක් අයට හොඳ දේවල් ඉක්මනට අමතක වෙනවා. එහෙම කලොත් මොනමදේ වුනත් වැඩි කලක් පිහිටන්නේ නැහැ. එම නිසා අප සියලු දෙනාම කෘතගුණ සලකන යහපත් ගුණාත්මක හොඳ ජනතාවක් විය යුතුයි. මම අතිගරු ජනාධිපතිතුමාගේ සැම කටයුත්තකටම මට හැකි අයුරින් උපරිම සහයෝගය දක්වන්නයි මගේ එකම බලාපොරොත්තුව.

මෙතුමාට කොතරම තර්ජන ඇති වුණත් එතුමාගේ වැඩකටයුතු පෙරටත් වඩා සාර්ථකව කරගෙන ජනතාවට සෙත සදමින් ගම් නියම්ගම උදා කරමින් ජනසවි දෙමින් නව රැකියා අවස්ථා බිහි කරමින් අප දරුවන්ගේ අනාගතය ශක්තිමත් කිරීමට පමණක් නොව දීප්තිමත් කිරීමටද නව වැමමක් ඇති කරපු අපේ අතිගරු ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාට අපි සදාකල් ණයගැතියි.

ගරු ජනාධිපතිතුමා ආරක්ෂා වුනොත් පමණයි අපේ රට ආරක්ෂා වන්නේ. එසේ නැත්නම් අපේ රටත් අපිත් අනාගත පරපුරත් අනාථ වන බව නියැතයි. ජාති ආගම් කුල පංති

භේදයෙන් තොරව පොදු මහත් ජනතාවට සෙත සදමින් සමෘද්ධිමත් ලංකාවක් ගොඩනැගීමට නිතර වෙහෙසෙන මේ උදාර නායකයා ආරක්ෂා කර ගන්නා ලෙසයි.

| | |
|---|---|
| තෙරුවන් සරණ ජනපති වෙත | ලංවේවා |
| තිස්තුන් කෝටියක් දෙවිවරු | රැකදේවා |
| ජනපති යන මගෙහි නව මල් | පිබිදේවා |
| මගේ කවි නිමයි ජනපති නිති | සැරදේවා |

නිල ඇඳුම් වලට වැයවන මුදල් සියල්ලක්ම මේ අපි ඔබලා විසින්ම සම්මාදම් මුදල් ය. එකී මුදල් ළමා පරපුරගේ යහපතට සහ ප්‍රයෝජනයට යොමු කිරීමට යෙදවීමට මීට ඉහතින් කිසිදු කෙනෙක් විසින් කර නැති බව ඔබතුමන්ලා දන්නවා ඇති. එතුමාගේ මේ ශ්‍රේෂ්ඨ ක්‍රියාව අපි සියලු දෙනාම විශේෂයෙන්ම ශිෂ්‍ය දරු පෙළ අගය කල යුතු අතර අපි සියලු දෙනාම ඒ ගැන ගරු ජනාධිපතිතුමාට අපගේ හෘදයාංගම ගෞරවය සහ භක්ති ප්‍රණාමය පුද කරමි."

ඉර්ෂාඩ් ශිෂ්‍යයාට පොදුජන වේදිකාව නුපුරුදු තැනක් නොවේ. විටෙක එය ඔහුගේ පාසලයි. තවත් විටෙක ගෙදර වැනිය. කොතෙක් ජන ගංගාවක් සිටියත් අමුතු තැනක් ලෙස නොදැනුනි. මැති ඇමතිවරුන් පමණක් නොව පොදු ජනතාවද ඉතා ආදරයෙන් හඳුනයි. ඔහුගේ කථා අසන්නට ප්‍රිය කරයි.

ඉර්ෂාඩ් ගැන පොදු ජනතාව කතා වෙනවා මෙන්ම පුවත්පත් කලාවේදීන්ද සිය වාර්ථා වල ඉර්ෂාඩ් ගැනත් සඳහන් කලා. 1992 මැයි 6 වනදා ඇත්ත පුවත්පතේ "කෑම පැය" තීරු ලිපියේ උපහාසාත්මකව ඉර්ෂාඩ් දරුවා ගැන ලියා තිබුනේ මෙහෙමයි.


කෑම පැය



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

හසලක ප්‍රාදේශිය ගම් උදාව සමාප්ත කරමින් පැවති ජනහමුව. ජනතාව අමතන්නට ප්‍රේමදාස ජනාධිපතිතුමා මට අවස්ථාව ලබා දුන්නා. පුවත්පත් වාර්තාවක් ඇසුරින් ඒ කතාව ඉදිරිපත් කරමි.



# ජනවරම අයුතු ලෙස ප්‍රයෝජනයට ගන්නා හොරුන්ට මේ රජයේ කිසිම ඉඩක් නෑ

## හසලක ප්‍රාදේශීය ගම් උදුවේ සමාප්ති උළෙලේදී ජනපති කියයි

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ගමේ ජීවත් වන දුප්පත් අයගේ රැකියා ප්‍රශ්න විසඳන්න ඇඟලුම් කම්හල් නගරයෙන් ගමට අරන් ගියේ අපේ ජනාධිපතිතුමායි. මේ නිසා ගමේ දුප්පත් අයට රැකී රක්ෂා ලැබුණා එගේම ඔවුන්ගේ පවුලේ ආදායමත් වැඩිවෙලා හොඳ ජීවන තත්වයක් උදා වුණා. දස දහසක් පමණ පවුල් ජනාධිපතිතුමාගේ වැඩපිළිවෙල අනුව අද කාටත් අත නොපා ජීවත් වෙනවා. මා මේ කතාව කලේ මේ උදාර වැඩපිළිවෙලට උපහාරයක් වශයෙන් 1993 ජනවාරි මස 22 වන දින කොත්මලේ ආයතනයේ ඇඟලුම් කම්හල විවෘත කිරීමෙන් අනතුරුව පැවති ජනහමුවේදී.

*"ගරු කටයුතු නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ඇතුළු මහා සංඝරත්නයෙන්ද, හින්දු ඉස්ලාම් ක්‍රිස්තියානි ආගමික පූජකතුමන්ලා ගෙන්ද අවසරයි. අතිගරු ශ්‍රීමත් ජනාධිපති උතුමාණෙනි, ආණ්ඩුකාරතුමනි, නිවාස රාජ්‍ය අමාත්‍ය ඉම්තියාස් බාකිර් මාකර් මැතිතුමනි, මැති ඇමතිවරුනි, අනිකුත් සියලුම සම්භාවනීය අමුත්තනි, මව්වරුනි පියවරුනි, සහෝදර සහෝදරියනි.*

*අපේ අතිගරු ජනාධිපතිතුමාගේ උදාර මගපෙන්වීම යටතේ එතුමා අනුගමනය කරන එසේම ජාති ආගම කුල පංති පක්ෂ භේද නොතකා විදුලිය ලබාදෙමින් වෙළඳපොළ ඉදි කරමින් මාර්ග නතාමින් තිබෙන මාර්ග පුළුල් කරමින් ජල තටාක ඇති කරමින් අති විශාල සංවර්ධන කටයුතු රාශියක් බෙරුවල ප්‍රදේශයේ දියුණුවට දියත් කල ඒ වගේම කිව නොහැකි තරම් මහඟු සේවයක් ඉටු කරන නිවාස පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු ඉම්තියාස් බාකිර් මාකර් මැතිතුමන්ගේ ඇරයුමින් අතිගරු ජනාධිපතිතුමාගේ මග පෙන්වීම යටතේ මෙ පුංචි මට කතා කිරීමට මෙ අවස්ථාවේ ඉඩකඩ ලැබීම මම ජිවිතයේ වැදගත් අවස්ථාවක් හැටියට සලකනවා.*

*අම්මෙ තාත්තේ අයියේ අක්කේ අද අපි මෙ සහභාගී වන්නේ 10 වැනි ඇඟලුම් කම්හල විවෘත කිරීමෙ මාහැඟි අවස්ථාවටයි. මම දන්නා තරමින් මම අහල තියෙන පමණින් මෙවැනි යෝධ වැඩපිළිවෙලක් අපේ ලංකා ඉතිහාසයේ ඇතිවුණු පළමුවන අවස්ථාව මෙයයි. මෙතෙක් අපේ රටෙ බොහොමයක් අම්මලා තාත්තලා අයියලා අක්කලා රැකියා නොමැතිකමින් දැඩි දුක් වින්දා. ඒ නිසා මානසික අසහනයකින් පෙලුනා. කවා පොවා හැදූ වැඩූ දෙමාපියන්ට ඒ වගේම නෑ හිත මිතුරන්ට උදව්වක් උපකාරයක් කර ගැනීමට නොහැකිව දැඩි කම්පනයට පත්වී සිටි අවස්ථාවෙ පළාතෙන් පළාතට ගමින් ගමට යමින් පොදු ජන දුක සොයා බලා අපේ පිනට උපන් දේශයට පියෙක් වන අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමා මෙය හොඳින් දැන මෙ වැඩපිළිවෙල ක්‍රියාත්මක කලා. එහි ප්‍රතිපලයක් හැටියට අද දහස් ගණනක් ඒ දුක්විඳි අය මෙ ඇඟලුම් කම්හල් වල වැඩ කරලා හොඳ වැටුපක් ලබා තම සිතැඟියාවන් ඉටු කර ගන්නවා. ඒ තුලින් නැති බැරි අය ඇති හැකි අය වන බව අපට පැහැදිලිවම පෙනීගොස් තියෙනවා. ආර්ථික වශයෙන් ශක්තිමත් අයගේ*

උදවවෙන් ආර්ථික වශයෙන් දුර්වල ජනතාව ශක්තිමත් කිරීම මෙම වැඩපිළිවෙලේ මූලික අරමුණ වීම විශේෂ ලක්ෂණයක්.

බලන්න අම්මෙ තාත්තේ අයියේ අක්කේ මෙය ඉටු කරන්න මන්ද පෝෂණය තුරන් කරන්න දුප්පත්කම නැති කරන්න නැති බැරි අය ඇති හැකි අය කරන්න අප නායකයාණන් කොපමණ සේවාවන් දියත් කරලා තියෙනවාද කියලා. අධ්‍යාපනය, සංවර්ධනය, සෞඛ්‍යය, එපමණක් නොව උදාගම සංකල්පය, ජනසවිය, මාපිය කැපකරු ක්‍රමය, පාසැල් ළමුන්ට නොමිලේ පොත්පත් හා දිවා ආහාරය ලබාදීම ඒ විතරක් නෙවෙයි නොමිලේ පාසැල් නිල ඇඳුම කට්ටලයක් ලබාදිම වැනි දේ. මෙවා ගැන හිතනකොට මට හිතෙනවා අපේ ජනාධිපතිතුමා විශාල ජනතා මෙහෙවරක් කරපු නායකයෙක් කියලා. පැරණි කියමනක් තියෙනවා "කොතැනද කාසි එතැනටමයි හැම වාසි" කියලා. අපේ උතුමාණන් එය වෙනස් කර "කොතැනද දුගී දුක එතැනටමයි හැමදාම වාසි" ලැබෙන ආකාරයට සියලු වැඩකටයුතු සූදානම් කර තිබීම අප ලැබූ වාසනාවක්. මෙහෙම වෙනකොට නව සමාජයක් උදා වෙනවා කියන එක ඔබ අප සැමට රහසක් නොවේ.

අම්මෙ තාත්තේ අයියේ අක්කේ දුප්පත්කම ලබා උපන්කම නොවන බව අපේ ජනාධිපතිතුමා ඔප්පුකර තියෙනවා. අපේ ජීවිතවල පුදුමාකාර වෙනසක් දැන් ඇතිවී තියෙනවා. එතුමාගේ උවමනාව ගුණදම වලින් යුක්ත අනාගත පරපුරක් බිහි කිරීමයි. ඉංග්‍රීසි කියමනක් මෙන්න මෙහෙම තියෙනවා. "Manners make the man" එහි තේරුම හොඳ මිනිසෙකු වන්නේ හොඳ ගුණදම වලින් කියලා. අන්න ඒ නිසා තමයි අපේ ජනාධිපතිතුමා මා වැනි කුඩා පාසැල් දරුවන්ට මෙතරම් සැලකිල්ලක් දක්වන්නේ.

අතිගරු ජනාධිපතිතුමනි, ඔබතුමා දිවා රෑ නොතකා වෙලාවට කුසට හරිහැටි අහරක් නොගෙන අපේ මේ ඉන්දියන් සාගරයේ මුතු ඇටය වැනි කුඩා රට නංවාලීමට රටේ සාමය ඇති කිරීමට ඔබතුමා දරන උත්සාහය ප්‍රශංසනියයි. ඒ නිසා අප ලංකාවාසී සියලුම ජනතාවගේ සිත් දිනාගෙන අවසාන බව අප කාටත් පැහැදිලියි.

අතිගරු ජනාධිපතිතුමනි, ඔබතුමා අපේ ශක්තිය අවදිකර කාටත් අත නොපා නැගිටින්න උදව් කල නිසා පොදු ජනතාව ඔබ අමතක නොකරන බව නිරන්තරයෙන්ම විශ්වාසයි.

අවසාන වශයෙන් මම කියන්න කැමතියි මෙතුමා වැනි සමතෙක් මේ ලක්බිම නොසිටින බව. මෙ ලක්බිම මෙතුමා වැනි සමතෙක් නොසිටින නිසා පුංචි මම සැමදා ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ වැඩපිළිවෙල සදාකාලිකව අගයමින් ඔබ සමග සදා රැඳී සිටින අදහසින් මා සමුගන්නෙමි.

ස්තූතියි."

DAILY NEWS, WEDNESDAY JANUARY 08, 1992



President Ranasinghe Premadasa presents a token of appreciation to seven-year old Hussein M. Ershad who made a speech at the Jana hamuwa held after the opening of Milton Karunaratnagama in Mawanella on Monday. Also in the picture are Ministers Weerasinghe Mallimarachchi, S. Thondaman, Chandra Ranatunge, Tyronne Fernando and Mr. and Mrs. Milton Karunaratne. (Picture by Roland Perera)

හද බැඳි තුතිය මා වෙත පල කල අයුරු

මා විසින් තවත් ජනහමුවකදී පැවැත්වූ කථාවක්

"මා වැනි මුස්ලිම දරුවෙකුට උතුම ජනහමුවක් අමතා කථා කිරීමට අවස්ථාවක් ලැබීම මගේ භාග්‍යයක් කොට සලකන අතර එම අවස්ථාව මට ලබාදීම ගැන ගරු වීරසිංහ මල්ලිමාරච්චි මැතිතුමාට මාගේ ආදර ස්තුතිය පළමුව කියා සිටිනවා. අද අප සියලු දෙනා මෙ ස්ථානයට එක් රැස්වී ඉන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ උදාර සංකල්පයක් අනුව බිහිවූ ජනසවිය හෙවත් නැතිබැරි අය ඇති හැකි අය කිරීමේ වැඩසටහනේ සාර්ථකත්වය මල්වල නෙලාගැනීමේ වැදගත් අවස්ථාවක් සැමරීමටයි. අම්මෙ තාත්තේ අයියේ අක්කේ එදා කුසට අහරක් නැතිව හිසට සෙවනක් නැතිව දුක්විඳි ජනතාව අද දෙපයින් නැගී සිට ස්වශක්තියෙන් තම ආර්ථික තත්වය උසස් තත්වයකට පත්කර ගත්තේ කෙසේද? අපේ උදාර නායකතුමා විසින් බිහිවූ ජනසවිය නමැති විශිෂ්ඨ සංකල්පය තුලින් නොවේද? ජාති ආගම කුල පංති පක්‍ෂ භේදයකින් තොරව ක්‍රියාත්මක වන මෙම වැඩපිළිවෙලින් අද දුප්පතුන්ගේ ලෝකය අලෝකමත්වී තිබීම අපේ ජාතියේ භාග්‍යයක් නොවේද? ජනසවියෙන් නව රැකියා බිහිවුවා පමණක් නොව අලුත් භාණ්ඩ නිෂ්පාදනය වුණා වගේ තිබූ භාණ්ඩ නවීකරණය වුණා. රැකියා ප්‍රදානයේදී ජනසවිලාභීන්ට ප්‍රමුඛත්වය ලැබුණා. ඒ වගේම මෑතකදී ක්‍රියාත්මකවූ ඇහලුම කම්හල් වැඩසටහන යටතේ බිහිවූ රැකියා අවස්ථා අප කවුරුත් දන්නවා. ඔවුන්ගේ ජීවන තත්වය මෙ විදියට උසස් වනවිට අප වැනි දරුවන්ගේ පෝෂණය ඉගෙනුම හැදියාව විනය වර්ධනය වුණා. එහෙම නම ශක්තිමත් අනාගත පරපුරක් බිහිවූ බව ආඩම්බරයෙන් කියන්න ඕනා. අන්න ඒකයි මෙම වැඩපිළිවෙලේ විශේෂත්වය.

අම්මෙ තාත්තේ අයියෙ අක්කේ මා වැනි කුඩා දරුවෙක් දේශපාලනය කතා කරනවා නොවෙ. අපේ ජනාධිපතිතුමා ජනසවිය තුලින් අප වැනි කුඩා දරුවන්ගේ අනාගතය දීප්තිමත් කිරීමට ලබාදී ඇති අවස්ථාව අගය කරලා කතා කල යුතුයි. ජනසවිය නමැති අඩිතාලම තුලින් ශක්තිමත් අනාගත පරපුරක් බිහිකිරීම ගැන අපේ ජනාධිපතිතුමාට ළමා පරපුර වෙනුවෙන් මගේ භක්ති ආදරය මෙහිදී පුදකරමි.

අප දුප්පත් ජනතාව වෙනුවෙන් මෙතරම වටිනා සේවයක් කරපු කරන අපේ ජනාධිපතිතුමාව ඉවත් කරන්න නම මෙ ඉරහඳ පවතින තුරු හම්බවෙන්නෙ නැහැ. ඒක ඉබ්බන්ගෙන් පිහාටු ගන්නවා වගේ වැඩක්. ඔය යම යම අය අපේ ජනාධිපතිතුමා ගැන මොනවා කිවත් අපේ රටෙ මහජන මතය අපේ ජනාධිපතිතුමාට බව ස්ථිර වශයෙන්ම කියන්න පුළුවන්.

එතුමා යන මෙ ගමනට ඇතැම අය කරදර බාධක ඇති කෙරුවත් අපේ නායකතුමා ඒවායින් පස්සට යන නායකයෙක් නොවන බව ඔප්පුකර තියෙනවා. ගෙඩි තියෙන ගස්වලට තමයි ගල් ගහන්නෙ. අපේ මුහම්මද් නබි නායකතුමා කියා තියෙනවා නින්දා ප්‍රශංසා දෙකේදිම මහා ශෛල පර්වතයක් වගේ නොසැලි ඉන්න කියා. අපේ

ජනාධිපතිතුමා විශේෂයෙන් නින්දාවේදී නොසැලී ශෛල පර්වතයක් වගේ සිට එතුමා අප ජනතාව අනාථ නොකරන බව අප කාටත් විශ්වාසයි. එතුමාගේ ජයග්‍රහණය අපේ ජයග්‍රහණය වේ. එතුමාගේ කියමන අනුව අප කවරුත් ඊර්ෂ්‍යාවෙන් ක්‍රෝධයෙන් වෛරයෙන් වංචාවෙන් සූදුවෙන් සුරාවෙන් තොර සාමය සමාදානය සහිත දැහැමි සමාජයක් මෙ රට තුල බිහිකිරීමට උත්සාහ දැරිය යුතුයි. අපේ ජනාධිපතිතුමාගේ රසකවි සිතුවිලි කියන පොතේ එතුමා ලියන ලද කවියක් කීමට අවසර.

ඇඩෙනවා කඳුළු මාගේ දෙපයට පැගේ
ඒවා අපායෙන් ලද ගිනිදළු වාගේ
එනමුදු කමෙක් නැත දුක මසිතට නැගේ
මහජනයා මගෙයි මම මහජන යාගේ

එතුමාගේ කවියේ අදහස අනුව එතුමා කිවදේ ඉෂ්ට කරන හොඳ ආත්ම ශක්තියක් තියෙන එකම නායකයෙක්. මෙවැනි සේවාවන් රජයෙන් ලැබෙන කොට නිවහන් නැති අයට නිවහන් ලැබෙන කොට අතමිට හිඟ අයට අතමිට සරුවෙන කොට ස්වයං රැකියා දිනෙන් දින වර්ධනය වෙනකොට අප කාටත් සාධාරණය ඉටුවෙනකොට අපේ ජනාධිපතිතුමාටත් වර්තමාන රජයටත් විරුද්ධව මොන බලවේගයක් නැගී සිටියත් එයට එරෙහිව රටේ ජනතාව නැගී සිට අපේ ජනාධිපතිතුමා වටා එක්රොක් වන බව ප්‍රංචි මට ස්ථිර වශයෙන්ම කියන්න පුළුවන්.

දුප්පතුන් නැති ලෝකයක් බිහි කිරීමට කටයුතු කරන අතිගරු ජනාධිපතිතුමාටත් ජනසවි වැඩසටහනට නව ජීවයක් එක් කල ගරු වීරසිංහ මල්ලිමාරච්චි මැතිතුමාටත් දීර්ඝායු පතමි.

ඒ වගේම මම කියන්න කැමතියි මේ පළාත දියුණු කිරීම සඳහා මෙවැනි සේවාවන් ඉටු කිරීම මෙ පළාතේ සිටින සියලු දෙනාටම සතුටට කරුණක්. එමෙන්ම මෙ ප්‍රදේශය දියුණු කිරීමට අනහිත දුන් ගරු වීරසිංහ මල්ලිමාරච්චි ඇමතිතුමන් ගත් උත්සාහය අපි අගය කල යුතුයි.

අපේ ජනතාව කිසිදු භේදයකින් තොරව නගා සිටුවීමට අපගේ ජනාධිපති උතුමාණන් දරණ උතුමවූ උත්සාහය සාර්ථක කර ගැනීමට එතුමාණන් හට සෑම අයුරින්ම සහයෝගය දක්වන මැති ඇමතිවරුන් සහ නිලධාරීන් හටද අපගේ අවංක ආදරය හිමිවිය යුතුයි කියා අවසාන වශයෙන් මා සතුටින් ප්‍රකාශ කර සිටිනවා. අපේ උතුමාණන් අප අතර නිදුක් නිරෝගීව වැජබෙත්වා.

අද ශ්‍රී ලංකාවෙ වෙසෙන පොඩි දරුවන් වන අපහට අප රටේ නායක උතුමාණන් බැහැ දැක ගැනීමට ඇති අවස්ථාව අපි සියලු දෙනාම ඉතා ආදරයෙන් අගය කරමු.

ස්තුතියි.”

# කලාකාමී සිත පිබිදූදා

මව් පොලොව නමදිමි
එහි දුක් කඳුළු අමදිමි
නොරට සැප නොයදිමි
මෙහි මැ යලි උපදින්න අයදිමි

තිර අදිටන් මගේ
යන කල ගැටළු අපගේ
හිරු දුටු පිනි වගේ
ලිහෙයි යහපත පිණිස සැමගේ

මපියාණන්ට මම දෙවි කෙනෙකුට වැඩිය
ගරුකොට වඳින්නෙමි පෙම එතරම දැඩිය
ඔහු නැ පිරෙව්වෙ ඔහුගේ යටි මඩිය
එයවෙයි පියාණන් මට දුන් ජය කොඩිය

දහදිය හෙලනා කම්කරුවන් හට
පණ රැකගන්නට වැටුපක් දුන්නට
එය නොම සෑහේ අවුල ලිහන්නට
ලාබෙන් කොටසක් ඇයි බැරි දෙන්නට

ලද පසු උතුම් මහජනතාවගෙ වරම
නොතකා ඔවුන් ගැන අබ ඇටයක් තරම
බොනවට වඩා බලකාමෙහි හිම කිරම
වහබී මියෙනු රිසියෙමි මම එක් වරම

ජය ලද වෙලේ ආඩම්බර නොවේවා
පැරදුනු කලේ වත මුකුලිත නොවේවා
දුක සැම දෙකේදිම හසරැලි සැලේවා
සිතුවිලි කඩුව එතෙරවී දිලේවා

ආර්. ප්‍රේමදාස ශූරීන්ගේ 'රසකවි සිතුවිලි' තුලින් උපුටා ගන්නා ලදී.

සුචරිත ව්‍යාපාරය දිවංගත ජනාධිපතිතුමාගේ හදවත මෙන් විය. පුංචි මිනිසෙකුට රටේ උත්තරීතර පදවිය වන ජනාධිපති පදවිය දක්වා පැමිණිය හැකි බව ක්‍රියාවෙන් පෙන්වා දුන්නේ සුචරිතයයි. එදා එතුමන් බිහිකළ සුචරිතයට අදත් ලොකු කුඩා කාගේත් ප්‍රසාදය හිමි වන්නේ ඒ නිසයි. සුචරිත ව්‍යාපාරය පිළිබඳව එහි නිර්මාතෘ දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිඳුන් ලියා ඉදිරිපත් කල සුචරිතයේ සටහනක් මගේ පොත තුලින් ඔබ හමුවට ගෙන එමි.

*'සුචරිත දිවි යයි*
*පිවිතුරු අවි යයි*
*පොදුජන සවි යයි*
*ජය වැඩ වෙත යයි'*

*මා කුඩා වියෙහි සිට මෙ වනතුරු සුචරිත මග දිගේ ආවෙමි. සිරුරෙහි රුධිරය හා මාංශ මෙන් මා හා සුචරිතය වෙන් නොවෙයි. දෙගුරුන් ගෙන් මා ලද ආභාසයෙන් පසු මා සිත ගමන් කලේ සුචරිත පදනම මතයි.*

*උද්ගත වන ප්‍රශ්නය දෙස තුලනාත්මකව බලන්නටත් සමාජ සාධාරණත්වය රකින්නටත් හැමෝටම සමාන අවස්ථාව උදා කරන්නටත් මියයන තුරු හැකි ආකාරයකින් සමාජයට සේවයක් කරන්නටත් මම මෙන්ම අනෙක් තැනැත්තා ද මනුෂ්‍යයෙක්ය යන හැඟීම ඇතිව වැඩ කරන්නටත් මා උගත්තේ සුචරිතයෙනි.*

*මහ පොළොව මත දෙපා තබා ජීවත්වන හැම මනුෂ්‍යයෙක්ම තමන්ට හමුවන අනෙක් මනුෂ්‍යයාට කිසියම් ආකාරයකින් උපකාරයක් කිරීම මනුෂ්‍ය ජීවිතයේ පරමාර්ථය විය යුතුය. මා මිනිසත් බව තේරුම් ගත්තේ සුචරිතයෙනි. මිනිසුන් ලංවන හැටිත් වෙන් වෙන හැටිත් මම එහිදී දුටුවෙමි.*

*සාමූහික වගකීම, පරාජයේදී පසු නොබැසීම, ජයග්‍රහණයේදී උදම නොවීම දුක සැප ගල් මුල් මෙන්ම මල් පොකුරුද පිළිගැනීම, නැගීම, බැසීම, මිනිසා නොමිනිසා මේ සියල්ල මට හඳුන්වා දුන්නේ සුචරිතයයි.*

*මම දේශපාලනය සඳහා සුචරිතය පාවිච්චි නොකලෙමි. එහෙත් දේශපාලනය තුලින් සුචරිතය ව්‍යාප්ත කිරීමට වෑර දරමි. කඳු මුදුනට නැගුනද මම පිටියාවත බලමි. මේ සියල්ල මට ලැබුනේ සුචරිත පහන් වැටියෙන් මා දේශපාලන චින්තනය දල්වාගත් බැවිනි.*

*කල් යෑමේදී සමාජ සේවය විසින් මම දේශපාලනයට යොමු කරනු ලැබුවෙමි. එදා මෙදා තුර මා දේශපාලන කරලියෙහි දෙපා තබා නැගී සිටියේ සුචරිත අඩිතාලම මතය.*

*විඩා පත් දිවි කතරේ සෝම භූමිය ලෙසත් වාලුකා තලාවේක සිතාමෙසන දිය බිඳුව ලෙසත් මම සුචරිතය දකිමි.*

*මිනිසකුට තව මිනිසෙකු හඳුනා ගන්නට සුචරිතය උපකාරී වේවා! හැම මනුස්සයකුටම සුචරිත පහන් සිළුවේ ආලෝකය ලැබේවා! අද යලි දල්වන සුචරිත පහනේ එළියෙන් මිනිසත් බව හඳුනන තවත් මිනිසෙක් ගෙට අපට හමුවේවා!*

*ආර්. ප්‍රේමදාස*

## ජනපති වනු මැනවි යලි හෙළ දෙරණ මත

සුචරිත මගෙන් මුළු ලෝකය ජය  ගත්තා
එඩිතර බවින් යුතු හන්දා මැති  ජගතා
චතුර හඩින් ලොව සැම දෙන වසඟ  කලා
මරුවා විගස පැමිණිලා මැතිඳුව  ගත්තා

දුප්පත් කමින් මිරිකී අපි ගෙවූ  දිවිය
මැති ඔබතුමාට පින් සිදුවන්නට  නිමය
එදා අප රැකගත්තේ මැති දුන් ජන  සවිය
පෙම්දස් මැතිඳු මිස නෑ කව්රුත්  අගය


දුප්පත් එවුන් ගැනමයි නිරතුරු  සිතුවේ
ඔබේ සුබ විවරණය නෑ ඔබතුමා  තැකුවේ
දිවා රෑ නොබලා මගේ රට වෙත කල  සේවේ
මැරුණත් මැතිඳු නෑ අපි අමතක  කෙරුවේ

කිව්දේ කලා කලදේ හරියට  කිව්වා
නැතිබැරි අයට ඔබ මහ කප් රුක  වූවා
හිසට සේවනදී දුගියන් රජ  කෙරුවා
ඔබ මුව නොදකින්න අප සැම පව්  කෙරුවා

උන්ඩෙන් නොවේ ජයගත්තේ  ඡන්දයෙනි
ඔබ සිහි කරන්නේ හදපිරි  ගෞරවෙනි
අද අසරණය අප සැමදෙන  පෙම්දසුනි
යලි මෙහි වඩිනු සුරලොව සැප වින්දා  ඇති

තිසරණ සරණ පැතු යන එන සතර  අත
මානව දයාවෙන් උතුරා තිබුණි  සිත
මේ ලක් දෙරණේ සුදිලුණු අප මැණික්  කොත
ජනපති වනු මැනවි යලි හෙළ දෙරණ  මත

Daily News - TUESDAY, NOVEMBER 12, 1991



President Ranasinghe Premadasa at the opening ceremony of A.M. Munasinghegama, a re-awakened village in Homagama on Sunday. Addressing the gathering is Hussein M. Ershad a little boy from Colombo. Also in the picture are Ministers Sirisena Cooray, Weerasinghe Mallimarachchi, State Minister Gamini Lokuge, Chief Minister Western Province Susil Moonesinghe, Colombo District SLFP MP Stanley Tilakaratne and Desabandu A.M. Munasinghe. (Picture by Bandula Alahakoon).

•Muslim student welcomes President in fluent Sinhala

# Any attempt to remove President from office will be futile

An eight-year-old Muslim student Mohamed Ershard, created quite a sensation when he spoke in perfect Sinhala welcoming the President and other visitors at the *Jana Hamuwa* held soon after the opening of the "Munasinghagama" model village in Homagama on Sunday.

Here is the English translation of the Sinhala speech recorded off the tape.

Ven. Sirs, Your Excellency, Hon Ministers and Members of Parliament, distinguished mothers, fathers, brothers and sisters,

"To begin with I wish to say that as a young child from a poor family I have been able to get on to a stage such as this, thanks to the noble concept of His Excellency the President.

"It is also my good fortune that I got this opportunity. To be more precise, I am a Muslim child. It proves that our President treats every body alike be they rich or poor, whatever their race or religion maybe.

"Let me say, what brought me on to this stage. I want to make a short speech about our country, and about our President.

"In regard to the situation prevailing in our country, I realise the situation to a certain extent though not as much as you. There are some who are trying to get rid of our President from office, despite all that he had done to develop the country. But let me as a young child say one thing to my parents and brothers and sisters. Let me say as long as the sun and moon rise over this country, no one will be able to remove our President from office. Any such attempt would be futile - like expecting to pluck feathers from a tortoise. Whatever anybody may say of our President, I can tell you from my childish instinct that the people of this country are with the President always.

"As you will see, dear parents, brothers and sisters, our President is a man who keeps to his word. He does what he promises to do. He speaks of what he does. (He related a Sinhala verse from the book of poems "*Piliyauthan Pulami*" at this stage) In keeping with that poem the President had done what he had promised to do. He had spoken of what he had done. He had looked at small people like us at the foot of the mountain after climbing its peak.

"This great leader of ours did not enjoy the comforts of a life in Colombo. He went from village to village. He went from house to house. He saw the plight of the poor with his own eyes. And, then, he launchd the Janasaviya to help them. He took every step to help poor children in their education. He set about developing the country by developing the villages.

"Dear parents, would there be ever another leader such as he? It is very rarely leaders like these are born. Let us therefore protect our President like our own eyes. It is only then that the future of children like us, your future and our country would be secure and prosperous."

Mohamed Ershad ended his speech by reciting another Sinhala verse invoking blessings from the Gods to give health and strength to the President who had come in for world fame through service to the people.

1991 වසරේ කැළණි ගඟ හරහා පෑලියගොඩ ජපන් රජයේ ආධාර යටතේ ඉදි කරන ලද "ජපන් ශ්‍රී ලංකා මිත්‍රත්ව පාලම" විවෘත කිරීමෙන් පසුව පෑලියගොඩ පැවති ජනතා රැලියට සහභාගී වෙමින් එම වේදිකාවේ සිට මා පැවැත්වූ කථාවයි මේ.

*"ගරු කටයුතු සියලුම ආගමික නායකතුමන්ලාගෙන් අවසරයි. අතිගරු ජනාධිපති උතුමාණෙනි, මැති ඇමතිවරුනි, අනිකුත් සියලුම ප්‍රභූවරුනි, මව්වරුනි, පියවරුනි, සහෝදර සහෝදරියනි.*

*මම කැමතියි පළමුවෙන්ම අපේ ගරු ජනාධිපතිතුමා ගැන මා දන්නා තරමින් සුළු හැඳින්වීමක් කරන්න. එතුමාගේ කුඩා කාලය පුංචි අපට ආදර්ශමත් එකක්. එතුමා පුංචි කාලයේ එතුමාගේ වයසේ ළමයින් 6 දෙනෙක් සමග එකතු වෙලා ව්‍යාපාරයක් ආරම්භ කලා. ඒ තමයි අද මුළු ලංකාවටම විශාල සේවයක් ඉටු කරන ශ්‍රී සුචරිත ව්‍යාපාරය. ඒ සුචරිත ව්‍යාපාරය මගින් සමාජ සේවාවන් රාශියක් සිදු කරනවා. එකක් තමයි සිංහල දෙමල මුස්ලිම් බර්ගර් ආදී වශයෙන් විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉගෙනුම ලබන "ශ්‍රී සුචරිත රාත්‍රී නිදහස් පාසල" මමත් එහි ඉගෙනුම ලබන ශිෂ්‍යයෙක්.*

*අපි දන්නවා ගඟක් ගලා යන විට නොයක් බාධක හමුවෙනවා. විශාල ගල්පර හමුවෙනවා. ඒවායේ හැපෙනවා. නමුත් ගඟ කුමන බාධක තිබුනත් නව නවත් ජලය පිරිසිදුවී ගලා යනවා. අන්න ඒ වගේ මුළු ලංකාව පුරාම ගලා යන සුචරිත ගංගාවටත් අද අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමා බවට පත්වී සිටින එහි නිර්මාතෘ ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස උතුමාණන්ට නොයෙක් බාධක ආවත් ඒ කිසිවකින් එතුමා පරාජය කරන්න බැරි වුණා. අද නිමකරන්නට බැරි සේවයක් පොදු ජනතාව වෙනුවෙන් එතුමා ඉටු කරනවා.*

*බලන්න මව්වරුනි පියවරුනි සහෝදර සහෝදරියනි අපේ අතිගරු ජනාධිපතිතුමා දිවා රෑ නොතකා හරියට කුසට අහරක් වත් නැතිව ඉතාමත් ඕනෑකමින් තමන්ගේම දෙයක් වගේ අපේ රට දියුණු කරන්න කොයි තරම වෙහෙසෙනවා ද කියලා. ඉන්න ගෙවල් නැතිව දුකින් ජීවත් වුන අය අද ඉතාමත් සතුටින් ඉන්නවා. ඊට හේතුව කුමක්ද? අතිගරු ජනාධිපතිතුමාගේ නිවාස පහලොස් ලක්ෂයේ උදාර සංකල්පය නිසා නොවේද? එමෙන්ම සෙවණ සරණ මාපිය කැපකරු ක්‍රමය නිසා අධ්‍යාපනය කඩාකප්පල්වූ අපි වගේ පුංචි*

ළමයින්ට පාසැල් යන්න ලැබුණා. දෙමවපිය ආදරය නැතිවූ පුංචි දරුවන්ට මාපිය පිරිසකුත් ලැබුණා.

මව්වරුනි පියවරුනි සහෝදර සහෝදරියනි මෙතරම විශාල වැඩකොටසක් කලා නම දැන් එතුමාට කල නොහැක්කක් තිබේද? ඔබ සැම රට තුලට නෙත් යොමා බලන්න. එතුමා කල සේවාවල් සියැසින් දැකගන්න පුළුවන්. එතුමා යම් දෙයක් කරනවා කිව්වොත් තම ජීවිතය පරදුවට තබා හෝ එය ඉෂ්ට කරනවාමයි. පොරොන්දු ඉටුකළ නායකයන් අතරින් එතුමාට ලැබෙන්නේ පළමු තැනයි. ශ්‍රී ලංකාවාසි ජනතාව පමණක් නොව මුළු ලෝකයම අද එක හඩින් කියන දෙයක්. මෙවැනි උතුමෙක් අගය කිරීම එතුමාගේ සේවය පැසසීම අපේ යුතුකමක් නොවේද කියා අපි කව්රුත් දන්නා පැරණි කියමනක් තියෙනවා. "ඇවිදින අයටමයි දෙපයට කටු ඇනුනේ" කියලා. ඒක ස්වාභාවික දෙයක්. ඉතින් මව්වරුනි පියවරුනි අපේ නායකතුමාටත් ඒ සොබාදහමටයි මුහුණ දෙන්න වෙලා තියෙන්නේ.

මෙ පුංචි මට හොඳටම විශ්වාසයි පොඩි කටු නොවෙයි විශාල කටු ඇනුනත් අපේ ජනාධිපතිතුමා ඒවායින් පස්සට යන කෙනෙක් නෙවෙයි. මෙතුමාගේ එකම පැතුම ජනතාවගේ සුභ සිද්ධිය සැලසීමයි. එහෙම කියනකොට මට මතක් වෙනවා 1976 වර්ෂයේ මම ඉපදෙන්නත් කලින් එතුමා ලියපු පොතක් රසකවි සිතුවිලි කියලා. එම පොතේ ඡායා පිටපතක් මා ළඟ තියෙනවා. ඒකේ මෙන්න මෙහෙම කවි කීපයක් තිබුණා.

මිනිසුන් තරම මගේ මෙ මව් පොලොව මත
වටිනා වස්තුවක් වෙන මා දුටුවෙ නැත
ඒ වස්තුවම රැකගන්නට යොදමු හිත
සියලුම ඉසුරු ඔවුනගේ දෑහදියෙහි ඇත

මහජනයාට යුතුකම ඉටු කරන්නට
පසුබට නොවෙමි මා හිටියත් පියමි පිට
ඔවුනගේ දෙපා යට ඔවුනට පෙනෙන්නට
දූවිලි පොදක්වි තුටුවෙමි තැලෙන්නට

එතුමා අද මෙ තත්වයට ආවේ එවැනි උදාර සිතුවිලි වලින් පිරුණු නිසයි. මෙ තුලින් ජනතා දුක නිවී එසේම අපේ රට දියුණු කිරීමට එක්කර ඇති

සුචරිත නිදහස අත් වේවා
සිරිලක් මව සුව පත් වේවා

යන උදාර අදහස ක්‍රියාත්මක කල දාට ජාති ආගම් කුල මල පක්‍ෂ භේදයෙන් තොර ජන සමාජයක් මෙරට තුල ඇති වෙනවා යනු මගේ හැඟීමයි.

එතුමා කිසිම ආගම ජාති ලොකු කුඩා උස් පහත් භේදයෙන් තොරව කාටත් එක සමානව සේවය කරන නිසයි මටත් මෙවැනි අවස්ථාවක් ලැබුනේ. මට හොඳටම ඇහිලා තියෙනවා අපේ ජනාධිපතිතුමා නිතරම කියනවා අපි ඉපදෙන විට යම් ජාතියකට යම් කුලයකට ආගමකට ඇතුලත්ව ඉපදෙන්නේ නැහැ. අපි ඉපදුනාට පස්සෙයි අපි දන්නේ මේ සිංහල ද දෙමළ ද මුස්ලිම් ද බර්ගර් ද කියලා. අපි කොයි කාගේත් ඇඟේ තියෙන්නේ එකම ලේ. එහෙම නම් ඇයි අපි බෙදී ජීවත් වන්නේ. අපි කවුරුත් එකට එක්වෙමු. රට රකින්න පෙරට යමු. අපේ රට හදන ඒවගේම අපිව ආරක්ෂා කරන අතිගරු ජනාධිපතිතුමා වටේ අපි එක්වෙමු. අන්න ඒකයි අප කල යුත්තේ.

ජාතිය කුලය ආගම නැහැ සැලකුවේ
කාටත් එක ලෙසයි ජනපති සෙත සැදුවේ
එවැනි අයෙක් කලකිනි ලොව බිහි වූවේ
ඔහු රැකගනිමු ඒකයි අප සතු සේවේ

මම අවසාන වශයෙන් පුංචි දරුවෙක් හැටියට කියන්න කැමතියි ජනපති මැතිඳුන් අපට විශ්වාසයි. එතුමාගේ ගුණ ධර්ම අපි ඉගෙන ගත යුතුයි. අපේ රටටත් අප සැම දෙනාටත් සාමයෙන් සෞභාග්‍යයෙන් පිරි අනාගතයක් උදාවේවා කියා පතමින් මම මේ පුංචි කවිය කියලා අවසන් කරන්නම්.

පොඩි අය සමග මතු ලෝකය සුවඳ දෙනා
දහසය වැනි වියේදී සුචරිතය තනා
ඒ මග යමින් රට දැය සමය පුබුදනා
ජනපති දිනේ දිගුකල් දිනමිණ ලෙසිනා”

නැති බැරි උන් ටික දියුණු කරන්නට අත දුන්නේ කව්රු
දුප්පත්කම අපේ සුදුසුකමක් ලෙස පිළිගත්තේ කව්රු

අව්වට වැස්සට අපට සිටින්නට නිවෙස් හැදුවේ කව්රු
සුදුසු කමට නිති නිසි තැන දෙන්නට මුල පිරුවේ කව්රු

උණ්ඩය පරදා ඡන්දය ජයගත් ඒ විරුවා කව්රු
ගොවියා රජකළ දිළිඳුන් නැතිකළ ඒ ජගතා කව්රු

නැතිබැරිකම දුරු කරන්න ජනතාවට සෙවණ දෙන්න ජනපතිඳුන් බිහිකළ උදාර සංකල්පය ගම් උදාවයි. බුත්තලදී පැවැත්වූ 14 වැනි ගම් උදා සංවත්සරය නිමා කෙරුණු ජූලි මස 3 වන දින ගම් උදා භූමියේදී ජනහමු වේදිකාවේදී ලක්ෂ සංඛ්‍යාත ජනකායක් සහභාගිවූ දැවැන්ත වේදිකාවක මා පැවැත්වූ කථාවයි මේ.

*"14 වන ගම උදා සංවත්සර වේදිකාවේ සිට ශ්‍රීමත් ජනාධිපතිතුමා ඇතුළු ගරු ඔබතුමන්ලා ප්‍රංචි මුස්ලිම් දරුවෙක් වන මා අමතන්නේ හද පිරි සන්තෝෂයෙනි. මේ අවස්ථාව මා හට ලැබීම මාගේ වාසනාවක් හැටියටයි මා සලකන්නේ.*

*මව්වරුනි පියවරුනි අද අප සැම මේ පැමිණ සිටින්නේ 14 වන ගම උදා සංවත්සර භූමියටයි. අද අප සැම මෙම ගම උදා ප්‍රදර්ශනය නැරඹුවාට පසුව අපට නිසැකයෙන්ම අවබෝධ වෙනවා කව්රු හෝ මේ ගම උදා සංකල්පය මගේ මව් රටට හඳුන්වා දුන් ඒ උදාර පුද්ගලයාට මුළු ජාතියම ණයගැති බව. මම මේ ප්‍රකාශ කරන්නේ මට අවබෝධ වන හැටියටයි. එසේ අප ණයගැති වන කැනැත්තා කව්ද? ඒ වෙන කිසිවෙකු නොව අප ශ්‍රී ලංකා දෙරණේ ජාති ආගම් කුල පංති භේදයෙන් තොරව දැහැමින් රට පාලනය කරන ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමායි.*

*මේ ගම උදා සංකල්පය ඇති වෙලා තියෙන්නේ මේ පුංචි මම ඉපදෙන්නත් ඉස්සර. පළමුවෙනි උදාගම ඇති වුනේ යාපහුව මැතිවරණ කොට්ඨාශයේ බඩල්ගම නමැති ගම්මානයේ ය. එම පළමුවෙනි ගමේ නම උදාගමයි.*

*අද හිසට වහලක් නැති ලක්ෂ සංඛ්‍යාත දරු පවුල් වලට නිවෙස් සපයන මේ උදාර වැඩසටහන පිළිබඳ මූලික කතාබහ කෙරුනේ සියලුම සම්පත්වලින් පිරි වායු සමීකරණය කරපු තරු පහේ හෝටලයක නොවේ. මම අහල තියෙනවා අතිගරු ජනාධිපතිතුමාගේ උදාගම සිතුවිල්ලක් ගැන. එම මූලික සාකච්ඡාව පැවතුනේ පළමුවෙනි උදාගම ඉදිවූ බඩල්ගම නමැති ගමේ සියඹලා ගහක් යට බව. ඒ කුඩා සියඹලා ගහ අද මහා සියඹලා ගහක්වී මුළු මහත් ලංකාවාසී ජනතාවටම එල නෙලා ගත හැකි රුක්ෂයක් වෙලා. ඒ වගේම මෙම උදාගම් වැඩපිළිවෙලින් අද නිවාස නමැති මල් ලක්ෂ ගණනක් පිරී මහා රුක්ෂයක් බවට පත්වෙලා. මුල්ම උදාගම බිහිවූ එම ගමේ ජීවත් වෙලා තියෙන්නේ අනුන්ට මැලමෙහෙවර කරමින් පාරේ සිංදු කියමින් රබන් කරකවමින් යමක් කමක් සොයාගත් ඉතා දුකසේ දිවි ගෙවූ අන්ත දුගී දුප්පතුන්ය. එදා පළවැනි උදගමින් අංග සම්පූර්ණ නිවාස 33 හදලා දීලා තියෙනවා. මෙන්න මෙකයි මම අහල තියෙන හැටියට අද අපි සමරන ගම් උදා උත්සවයේ මූලාරම්භය කෙටියෙන්.*

මව්වරුනි පියවරුනි එදා ඉඳන් අද වන විට උදා ගම් 744 ක් බිහි කරලා තියෙනවා. ගම් උදා සංවත්සර ප්‍රදර්ශන 13 ක් පවත්වලා තියෙනවා. ගම් උදා සංවත්සර ප්‍රදර්ශන 13 ක් පවත්වලා තියෙනවා. අද අපි මේ සමරන්නේ 14 වැනි ගම් උදා සංවත්සරයයි.

සමහර අය කියනවා මේ මුදල් නාස්ති කරන වැඩපිළිවෙලක්ය කියලා. එහෙම කියනවා ඇත්තේ මේ ගම් උදා ප්‍රදර්ශන භූමියකට පය ගහලවත් නැති අයයි. මෙම ගම් උදා ප්‍රදර්ශන භූමිය නරඹන ඕනෑම කෙනෙකුට තේරුම් යනවා මෙහි මොනතරම් වැදගත්කමක් තියෙනවාද කියලා. ගම් ප්‍රදර්ශන කුටි තුලින් ඉගෙන ගන්නට ගොඩක් දේවල් තියෙනවා. ස්වයං රැකියා සඳහා උපදෙස් හා දැනුම වර්ධනය නවීන කාර්මික හා කෘෂිකාර්මික ක්‍රම ආදී විවිධ අංශයන් ගැන මනා අවබෝධයක් මේ තුලින් ඇති කරගන්න පුළුවන්. ඒ වගේම මේ ඉදිකර ඇති ගොඩනැගිලි මේ ප්‍රදර්ශනයෙන් පසුව මොණරාගල දිස්ත්‍රික්කයේ යෝජිත අනුබද්ධිත විශ්ව විද්‍යාල බවට පත්වෙනවා. එය තුලින් නව එළියක් ඇති වෙනවා. එහෙම නම් කොහේද මේය මුදල් නාස්තියක් වන්නේ කියලා මම අහන්න කැමතියි.

එදා අපේ හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා උදාගම් සංකල්පය ගැන මෙන්න මෙහෙම කියලා තියෙනවා. "උදාගම් වැඩපිළිවෙලේ පරමාර්ථය නිවාස සෑදීම පමණක් නොව ගම් හැදීම, රට හැදීම, ජාතිය දියුණු කිරීම වැනි උදාර පරමාර්ථ මෙහි ගැබව ඇත. අපේ රටේ මුල් බැසගෙන ඇති මෙම ව්‍යාපාරය කිසිවෙකුට උදුරා ගන්නට නොහැක."

බලන්න මව්වරුනි පියවරුනි එතුමාගේ එම කියමන අනුව ඇත්තෙන්ම අපිට පිළිගන්න පුළුවන්. ගම හැදුනොත් තමයි රට හැදෙන්නේ. එවිට තමයි රට ජාතිය දියුණු වෙන්නේ. එවිට තමයි අප කිසි කෙනෙකුට අත නොපා අපේ දෙපයින්ම නැගිටින්න පුළුවන් වන්නේ කියා.

බලන්න අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ උදාගම් සංකල්පයේ මහිම. ගම පිබිදෙන කොට මුළු රටම පිබිදෙනවා. මුළු ජනතාවම අවදි වෙනවා. මුළු ජනතාවක් රටක් බැබලෙනවා. එහෙම වෙනකොට නැවතත් පැරකුම් යුගයක් ශ්‍රීමත් ජනාධිපතිතුමා නිසා උදා වෙනවා කියන එක හෙට උදේ ඉර පායනවා වගේ විශ්වාසයි. ගම් උදා වැඩපිළිවෙල ලියවී ඇත්තේ පොත්වල නොව ජනතාවගේ හදවත් තුලයි. එය ක්‍රියාත්මක වන්නේ අහසේ නොව මේ උදාර ශ්‍රී ලංකාවේ බව කියන්න කැමතියි.

ඒ වගේම පුරාණ කාලයේ ශ්‍රී ලංකාව පාලනය කරපු රජවරුන්ගේ උදාර වැඩපිළිවෙළවල් අද ඉතිහාසයට එක්වෙලා තියෙනවා. එම රජවරුන් කරපු වැව් දාගැබ් වෙහෙර විහාර ආදී දේවල් එම රජවරුන් නමින් ප්‍රසිද්ධවී තිබෙනවා. මේ පුංචි මගේ විශ්වාසයක් තියෙනවා පොදුජන යහපත පිණිස ආරම්භ කල මේ ගම් උදා සංකල්පය ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ නමින් රන් අකුරින් ලියවී ඉතිහාසයට එක්වන බව.

එතුමා දැනගෙන සිටියා ලොකු අය වඩාත් ලොකු වන්නේ කුඩා අයට ලොකුවට උදව් කල පමණටයි කියන එක. කුඩා අයට ලොකුකම පෙන්වීම සඳහා ලොකු අය කුඩා අය පාගා දැමීමට වෙර දැරුවොත් සිදුවන්නේ කුමක්ද කියා. ලොකු කමේ කුඩා බව ඉස්මතු වීමත් කුඩා අය වඩාත් ලොකුවට මූර්තිමත් වීමක් සිදුවන බව. එමනිසා අපගේ ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ රජය ආර්ථික වශයෙන් නැතිබැරි අය නගා සිටුවනවා. සාමාජික වශයෙන් නැගී සිටින ජනකොටස් වලට සාධාරණය ඉටු කරනවා. එය විරුද්ධ පක්ෂ වල අය පවා පිළිගෙන හමාරයි.

සමහරු හිතාගෙන ඉන්නවා මා වැනි කුඩා ළමයෙක් වේදිකාවකට නැගලා දේශපාලනය කතා කරනවා කියලා. නමුත් ඒ අයට වැරදිලා. රටේ අනාගතය භාරගන්න ඉන්නේ අප වගේ බාල පරපුරයි. ඉතින් ළමා පරපුර නගා සිටුවන්න කොපමණ දේවල් අතිගරු ජනාධිපතිතුමා කරලා තියෙනවාද? මාපිය කැපකරු ක්‍රමය, ළමා පෝෂණය සඳහා දිවා ආහාර දීම, පාසැල් වලට නිල ඇඳුම වැනි දේවල් ළමා පරපුර නගා සිටුවන්නයි ඇති කරලා තියෙන්නේ. රැකවරණයක් නැති, පෝෂණයක් නැති, හික්මීමක් නැති, විනයක් නැති දරුවන් රටට බිහිවුනොත් රට භාර දෙන්නේ කාවද? අන්න ඒක නැති කරන්න අතිගරු

*ජනාධිපතිතුමා ගෙන යන වැඩපිළිවෙලට මා වැනි දරුවන් සහයෝගය දිය යුතුයි. අන්න ඒකට අතිගරු ජනාධිපතිතුමාට කළගුණ සලකන්නයි මා මේ වේදිකාවට නැග්ගේ.*

*අද ශ්‍රීමත් ජනාධිපතිතුමාට මෙම වැඩපිළිවෙල ගෙන යන්නට උදව් කරන ගරු අගමැතිතුමාටත් පුංචි අපගේ ගෞරවය පුද කරන්නට කැමතියි. ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ සංකල්පනා මැනවින් තේරුම් ගෙන එතුමාගේ ජයග්‍රහනයේදීත් පරාජයේදීත් නොසැලෙන ඉන්ද්‍රඛීලයක් සේ කටයුතු කරන නිවාස හා ඉදිකිරීම් ඇමති ගරු ඩී. සිරිසේන කුරේ මැතිතුමාට ද අපගේ ගෞරවය හිමිවිය යුත්තේ මෙම වැඩපිළිවෙල නොනවත්වාම ඉදිරියට ගෙන යන්නට කැපවී සිටින නිසාය.*

*යාපනුවේ සියඹලා තුරුසෙවන මුළු ශ්‍රී ලංකාවටත් ලෝකයටත් සෙවණ දෙන වනස්පති වෘක්ෂයක් බවට පත් කරලමින් අවසාන වශයෙන් උදා ගම් සංකල්පය රටට හඳුන්වා දෙමින් ගම් උදාවෙන් මුළු රටම පුබුදු කළ ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාටත් 14 වැනි ගම් උදා සංවත්සරයටත් අතිගරු ජනාධිපතිතුමාගේ 68 වැනි ජන්ම දිනයටත් මුළු මහත් ළමා පරපුර වෙනුවෙන් මාගේ භක්ති ප්‍රණාමය පුද කරමින් පුංචි කවියක් කියලා මගේ කතාව අවසන් කරන්නම්.*

*උදා ගම් පිබිදිලා හැමතැන රටම නැංවී — අලංකාරයි*
*එදා සිටි පැල්පතේ දුක්විඳි දිලින්දාගේ — දුක හමාරයි*
*රටේ හිඟය තුරන් වීලා ඔවුන් ලද සැන — සුම උදාරයි*
*අපේ පෙම්දස් මැතිඳු රැකීමද යුතුකමකි එය — අපට බාරයි”*

ලංකාවේ සතර දිග් භාගයේම සියලු ජනකොටස් කිසිදු බෙදයකින් තොරව ගම් උදාව බලන්නට එනවා. විද්වතුන් කලාකරුවන් දේශපාලනඥයන් දෙස් විදෙස් ප්‍රභූවරුන් විවිධ ආගමික පූජකතුමන්ලා මෙන්ම ලොකු පොඩි කව්රුත් එකට එක්වූ තැනක් ගම් උදාව. බුත්තල වගේ දුර බැහැර පළාතක පැවැත්වූ ගම් උදාව බලන්නට මට එන්නට ලැබුනේ ජනාධිපතිතුමාට පිං සිදුවන්නටයි. ගම් උදාව බැලීමෙන් මම ගොඩක්දේ ඉගෙන ගත්තා. මං වගේ පාසැල් දරුවන් හද පුරා සතුටු වන හැටි මම ආශාවෙන් බලා සිටියා.

## මා ගැයූ ගී අතරින් ප්‍රේමදාස මැතිඳුන් වඩාත් ප්‍රියකළ ගීතය

අසරණ ජනතාව වෙත සරණක් වන්න
නව නිවහන් තනා ජන දුක නිම වන්න
ජනපති මැතිඳුගේ සේවය පස සන්න
අද මම මෙහි ආමි කවියක් පව සන්න

ගම් හදලා රට හදනා විලසිනේ
ජනපති ඇත ලෝකෙම අද පෙරමුණේ
නව නිවහන් තැනිලා රට බැබලුනේ
සුචරිත සෙවනේ සේවය රජවුණේ

ලක් මව ඇත අද සතුටින් පිබිදිලා
ජනපතිගේ ගෙල මල්දම් පැලඳිලා
ගම් උදාව මුළු රට තුල බැබලුණා .
ඒ නිසාම දුක් විඳි අය රජවුණා

ජනසවියෙන් නව රැකියා බිහිවුණා
පුංචි අපට ඉන් සහනය සැලසුණා
පාසලේදී ආහාරය ලැබෙනවා
ඉගෙන ගන්න ඉන් සවියක් ලැබෙනවා

රණ බිමේදී ඔබ රණසිහ රද වුණා
ජන සේවේදී ඔබ නිති පෙම්දස් වුණා
නමට උචිත ලෙස සේවය ඉටුකලා
නැති බැරි අය සදහට ඇති අය කලා

පැරකුම් යුගයක් නැවතත් බිහිවුණා
හෙළ දෙරණම කිරි පැණියෙන් ඉතිරුනා
ප්‍රේමදාස ජනපති නිති දිනේවා
උතුර දකුණ සාමය ඇති කෙරේවා

පද රචනය - නෙල්සන් ලියනාරච්චි

# දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා

මම සාමාන්‍ය පවුලක මුස්ලිම් දරුවෙක්. මම සුචරිත නිදහස් පාසලේ 2 වසරේ ඉගෙන ගන්නකොට එවකට පැවති ගම් උදාවකට ගීයක් ගායනා කිරීමට මට අවස්ථාවක් උදා වුණා. එදා මගේ හැකියාව දැනගත් එක්තරා උත්තමයෙක් කැලයේම පිපිලා කැලයේම පරවෙලා යන මලක් වෙන්න මට ඉඩ නොතබා මගේ හැකියාව දක්ෂතාවය ලෝකයට පෙන්වන්න මට අතහිත දුන්නා. මාව ඉදිරියට ගෙනාවා. ලස්සන පැහැපත් අනාගතයකට මට උරුමකම් කියන්නට ඉඩ සලස්වා දුන්නා. ඒ වගේම එදා සිට අද දක්වා නොයෙක් ආකාරයෙන් උදව් උපකාර කල එමෙන්ම අද කතා කිරීමට මට අවස්ථාව ලබා දුන් ගරු ඉම්තියාස් බාකිර් මාකර් මැතිතුමාටත් මගේ ගෞරව ආදරය පුද කරන්න කැමතියි.

මම වගේම තවත් අසරණ පුංචි දරුවන්ටත් දුප්පත් අහිංසක දරුවන්ටත් එතුමා අතහිත දුන්නා. තමන්ගේ දරුවන්ට වගේම ඒ දරුවන්ටත් ආදරණීය පියෙක් වුණා. ඒ ශ්‍රේෂ්ඨ උත්තමයා ඈත ගම් දනව් කරා ගොස් දුප්පත්කමින් පීඩිත වුනු අසරණයින්ට පිහිට වුණා. ඒ අසරණයින්ට තිබුණු එකම බලාපොරොත්තුව එතුමා වුණා. හිසට වහලක් නැති ලක්ෂ ගණන් මිනිසුන්ට එතුමා කප්රුකක් වුණා. ඒ දුප්පතුන්ගේ හදවත් වල තියෙන දුක වේදනාව හඳුනා ගත්තා. තමන් කෙරෙහි විශ්වාසය තැබූ ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ට ඒ විශ්වාසය රැකෙන පරිදි කටයුතු කලා. මෙ ලෝකයේ උතුම්ම වස්තුව මිනිසුන් ලෙස සැලකුවා. සවියක් නැති මිනිසුන්ට එතුමා සවියක් වුණා.

දුප්පත්කම නිසා සමාජයේ කොන් කෙරුණු ජනතාව ඉදිරියට ගෙනාවා. නිසි තැන් ලබා දුන්නා. ඇඟලුම් කම්හල් වැඩසටහන යටතේ බිහිවූ රැකියා අවස්ථා අපි කව්රුත් දන්නවා. ඔවුන්ගේ ජිවන තත්වය මෙ විදියට උසස් වන විට ඔවුන්ගේ දරුවන්ගේ ඉගෙනීම පෝෂණය හැදියාව විනයද වර්ධනය වුණා. ඒ වගේම ඔවුන්ගේ අනාගතයද දිප්තිමත් වුණා. මෙම අඩිතාලම තුලින් ශක්තිමත් අනාගත පරපුරක් බිහිවුණා. නෑදෑයෙක් හිත මිතුරෙක් නැති මිනිසුන්ට එතුමා විශ්වාසවන්ත නෑදෑයෙක් මිතුරෙක් වුණා. නියම මාර්ගෝපදේශකයෙක් වුණා. අවංක එඩිතර නායකයෙක් වුණා. කළගුණ දන්න ශිෂ්ඨ සම්පන්න මිනිසෙක් වුණා. රටට අමිල මෙහෙයක් ඉටු කලා. අඳුරේ ගිල්වුණු රටට මිනි පහනක් වුණා.

එමෙන්ම අනුබද්ධ විශ්ව විද්‍යාල ගම් මට්ටමට ගෙන ගියා. මෙවැනි ප්‍රගතශීලි පියවරවල් නිසා අපේ මිනිස් සම්පත් පදනම ශක්තිමත්ව තිබුණු බව පැහැදිලිව

[illegible] බලන්න මව්වරුනි පියවරුනි එදා ප්‍රාදේශීය මහලේකම්කම කාර්යාල පිහිටුවීම නිසා මහජනතාවට කරදරකාරී වූ බාධක හිරිහැර නැතිවුණා. එදා අපේ හිටපු දිවංගත ශ්‍රේෂ්ඨ නායකයාණන් නිතර වැඩ කලේ දර්ශනයක් මුල් කරගෙනයි. මෙ අවස්ථාවේ මට මතක් වෙනවා එතුමා සතුව තිබූ එම දර්ශනය. no politics. no communalism.

එතුමා නිතරම කියන තවත් දෙයක් තමයි දුප්පත්කම තුරන් කිරීම. එදා දුප්පත්කම නැති කරන්න එතුමා ගත්ත ක්‍රියාමාර්ගයන් අද අපි සිහිපත් කරන්නේ ප්‍රශංසනීයවයි. ගඟක් ගලා යනවිට නොයෙක් බාධක විශාල ගල්පර හමුවීම ස්වභාවිකය. නමුත් ගඟ කුමන බාධක තිබුනත් ජලය තව තවත් පිරිසිදු කරමින් ගලා යෑම නියතය. ඒ ආකාරයෙන් මුළු ලංකාව පුරාම ගලා යන සුචරිත ගංගාව එතුමා නිර්මාණය කලා. අපේ දිවංගත උතුමාණන් නොයෙක් බාධක ආවත් ඒ කිසිවකින් එතුමා පරාජය කරන්න බැරිවුණා වගේම සමාජය සුචරිතවත් කරන්න මග සැදුවා. අද නිම කරන්නට බැරි සේවාවක් පොදු ජනතාව වෙනුවෙන් එතුමා ඉටුකලා.

අප රටෙ තිබුණු ඒ මිණිපහන 1993 මැයි මස 1 වන දින අපගේ ජනතාවගේ අවාසනාවට නිවිලා ගියා. ඒ මිණිපහන නිවුනත් එයින් විහිදුනු රශ්මිය තවමත් අප අතර පවතිනවා. ඒ ආශිර්වාදය අපට තියෙනවා. මෙතෙක් වෙලා මා පැවසූ ඒ උත්තරීතර ශ්‍රේෂ්ඨ මිනිසා වෙන කවරුත් නොවේ. ඒ පුංචි මම දුටු දිවංගත ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ශ්‍රීමතාණන්ගේ ශ්‍රේෂ්ඨ චරිතයයි. ඒ ශ්‍රේෂ්ඨ උත්තමයාගෙන් විහිදුනු රශ්මිය ඉදිරියට ගෙන යමින් ඒ ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින් ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාටද රනිල් වික්‍රමසිංහ මැතිඳුන්ටද ප්‍රේමදාස ජනපතිතුමාගේ ආශිර්වාදය නොඅඩුව ලැබෙන බව අප විශ්වාස කරනවා. එය විශ්වාසයක් පමණක් නොව සත්‍යයක්. කිසිම භේදයකින් තොර ජනතාවට සෙත සදමින් සමෘද්ධිමත් ලංකාවක් ගොඩ නැගීමට නිතර වෙහෙසුණු අපේ දිවංගත රණසිංහ ප්‍රේමදාස ශ්‍රීමතාණන්ගේ ප්‍රතිපත්ති තවදුරටත් සාර්ථක ලෙස ඉදිරියට ගෙන යාමට ඔබ සැමට ශක්තිය ධෛර්ය ලැබේවා.

## Why such a cruel thing should happen to our president?

The people of Sri Lanka were sorry to miss our late president as his thoughts and activities which have helped them for many more years to come. He remains forever in my heart and mind as well as each and every citizens of Sri Lanka. He is the only leader who has sacrificed his own life for the up liftman of the living conditions of the down trodden masses of Sri Lanka Our late President Premadasa was quite different from other leaders who have ruled the country and had been adopted as one of the greatest leaders in the world.

Our president was a man of the people. He died fittingly in their midst in the celebration of the labour day. His thoughts are always with the humblest and the poorest and always worked for its success. He worked day and night as few men can work to make a success.

Our late President Ranasinghe Premadasa was a human being of great political courage. He was able to do only a part of his programmes and plans. No one would have dreamt then that this common man who started his political career from St, Sebastian ward would rise to the pinnacle of Sri Lanka politics. We have lost a great man of Sri Lanka and friend of common man above factor of the poor and a great leader who stood for the unity of this country. He called upon everyone to join hands to develop the nation in keeping with the Premadasa policies. The most appropriate way to Honour our great leader is to continue his policies towards betterment of the common man from among whom he rose to the highest position in his political career.

Let us remember Late President Premadasa's last words. "You May Destroy My Body, but Please Do Not Assassinate My Character."



# මට වෙඩි තබා නැති කළාට කමක් නෑ
# මගේ චරිතය ඝාතනය කරන්න එපා

## කිරුළපන පැවති අවසන් රැලියේදී ජනාධිපති කියයි

එතුමා සිය අන්තිම කතාව තුලින් අපට පැහැදිලි කලේ ජන සමාජයේ ජිවත්වන පුද්ගලයින් නිර්දෝෂී නම් කවදා හෝ සත්‍යය ජයගෙන නිර්දෝෂීභාවය ජනතාවට වටහාදෙන බවයි. අසත්‍යය පරාජය වන බවත් කවදා හෝ සත්‍යය ජයගන්නා බවත් අන් ආගම දහමින් අපට උගන්වා තිබෙනවා. එලෙසම ප්‍රේමදාස මැතිතුමන්ට එතුමන් ජිවත්ව සිටි කාලයේ නොයෙක් බොරු චෝදනා කල අය කවදා හෝ යුක්තිය භාවයෙන් පරදවනු ඇත. එතුමන් මිය ගියේ ශරිරයෙන් පමණි. මතු උපදින දහසක් දරු පරපුරටත් මා වැනි කුඩා දරුවන්ටත් ගුණ සිහි කරගෙන සිටිය හැකිය. එතුමන් ඒ තරමටම රට දැයට මෙන්ම දරු පරපුරටද ආදරය කල හෙයිනි.



තිසරණ සරණ පැතු යන එන සතර අත
මානව දයාවෙන් උතුරා පිරුණු සිත
දුක් දුරු කල බලය ලබාදි නිතර සෙත
ජනපති වනු මැනවි යලි හෙළ දෙරණ මත

"මා මියෙන මොහොතේ
අවසන් කැලුම දෙනෙතේ
මව්බිමෙ නැවතේ
ඒ එලිය සදහටම පැවතේ"

("ප්‍රේමදාස පැතුම" රසකවි සිතුවිලි තුලින් උපුටා ගන්නා ලදී.)


ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

මගේ සිතට පෙම්දස් මැතිඳුන් නිතර නිතර සිහිපත් වෙනවා. එම නිසයි මම මෙම පොත එළි දක්වන්න තීරණය කලේ. එතුමා දියත් කල වැඩපිළිවෙල ඉදිරියට ගෙන යාම දිවංගත ජනාධිපතිතුමාට කරන විශාලතම උපහාරයයි. ජය පරාජයේදී නොසැලී සිටි එතුමා එම දුක් කම්කටොලු බාධක මැද පැමිණි ඒ දුෂ්කර ගමන අප කාටත් අපගේ ආත්ම ශක්තිය හා අධිෂ්ඨාන බලය මතුකර ගන්නට අනුබල දෙයි. ලිවීමෙන් සහ අලුත් දේවල් ක්‍රියාත්මක කිරීමෙන් ලද අත්දැකීම්ද එතුමාට මහෝපකාරී විය. අප රටට අති විශාල සේවයක් කල ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමන් කිසිදා අපට අමතක කල නොහැකියි. එතුමන්ගේ රුවගුණ අප තුල සදා රැඳී තිබෙන බවට කිසිම සැකයක් නැත. කිසිම භේදයකින් තොර සමෘද්ධිමත් ලංකාවක් ගොඩනැගීමට නිතර වෙහෙසුණු අපේ ජනපතිඳුන් ගිය මග අපි යලි පුබුදුවාලමු. ඉන්දියන් සාගරයේ මුතු ඇටය වූ අපේ රටට මහඟු සේවයක් ඉටුකළ අපේ ශ්‍රීමතාණන්ගේ ශ්‍රී නාමය වටා එක්රොක් වෙමු. එතුමා පැතූ සුචරිත ලොව අපි ශක්තිමත්ව ගොඩ නගමු.

-මොහමඩ් ඉර්ෂාඩ් හුසේන්-
0772366141

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය





Arex: 07777 29390